ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ගුරු අත්පොත

10 ශ්‍රේණිය

(2015 දී ක්‍රියාත්මක වේ)

විද්‍යා හා තාක්ෂණ පීඨය,

වාණිජ දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

Web:www.nie.lk
Email: info@nie.lk

Fo Pa

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

ගුරු අත්පොත

10 ශ්‍රේණිය

විද්‍යා හා තාක්ෂණ පීඨය,

වාණිජ දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

Fo Pa

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

10 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය 2014

ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

විද්‍යා හා තාක්ෂණ පීඨය
වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

Fo Pa

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී පළමුවන, හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදී. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

අතීතයේ සිටම අධ්‍යාපනය නිරන්තරයෙන් වෙනස්වීම් වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබුණි. මෑත යුගයේ මෙම වෙනස්වීම දැඩි ලෙස සීඝ්‍ර වී ඇත. ඉගෙනුම් ක්‍රමවේදවල මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතය අතින් හා දැනුම උත්පාදනය සම්බන්ධයෙන් ද ගත වූ දශක දෙක තුළ විශාල පිබිදීමක් දක්නට ලැබුණි. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ද 2015ට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අප්‍රමාදව සුදුසු පියවර ගනිමින් සිටී. ගෝලීයව සිදුවන වෙනස්කම් ගැන හොඳින් අධ්‍යයනය කර දේශීය අවශ්‍යතා අනුව අනුවර්තනයට ලක්කර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය පාදක කර ගනිමින් නව විෂයමාලාව සැලසුම් කර පාසල් පද්ධතියේ නියමුවන් ලෙස සේවය කරන ගුරු භවතුන් වන ඔබ වෙත මෙම ගුරු මාර්ගෝපදේශය පුද කරන්නේ ඉතා සතුටිනි.

මෙවැනි නව මග පෙන්වීමේ උපදේශන සංග්‍රහයක් ඔබ වෙත ලබාදෙන්නේ ඒ මගින් ඔබට වඩා හොඳ දායකත්වයක් ලබාදිය හැකිවේය යන විශ්වාසය නිසා ය.

මෙම උපදේශන සංග්‍රහය පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට මහඟු අත්වැලක් වනවාට කිසිම සැකයක් නැත. එසේම මෙය ද උපයෝගී කර ගනිමින් කාලීන සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්ති කාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත.

ඔබ වෙත ලබාදෙන මෙම ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලි දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වූයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් හා සම්පත් පුද්ගලයින් රැසකගේ නොපසුබට උත්සාහය හා කැපවීම නිසා ය.

අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය උදෙසා නිම වූ මෙම කාර්යය මා ඉතාමත් උසස් ලෙස අගය කරන අතර මේ සඳහා කැපවී ක්‍රියා කළ ඔබ සැමට මගේ ගෞරවාන්විත ස්තූතිය පිරි නමමි.

එම්.එෆ්.එස්.පී. ජයවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(විද්‍යා හා තාක්ෂණ පීඨය)

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන විෂයමාලා සම්බන්ධයෙන් දැනට පිළිගෙන ඇති ප්‍රතිපත්තිය අනුව සෑම වසර අටකටම වරක් සමස්ත විෂයමාලා සංශෝධනය කළ යුතුව ඇත. මෙසේ නව සංශෝධනයන් අවශ්‍ය වන්නේ දේශීය හා ගෝලීය වශයෙන් ඇති වන වෙනස්වීම් හා අභියෝගයන්ට මුහුණ දිය හැකි දරු පරපුරක් අප රටේ ද බිහිකළ යුතුය යන අර්ථවත් අපේක්ෂාව නිසා ය. ගතවූ කාලය තුළ දී ආර්ථික , දේශපාලන සමාජීය හා වාණිජ වශයෙන් මෙන්ම සමස්ත ගෝලීය වශයෙන් ද සමස්තව විශාල වෙනසකට පත්වෙමින් පවතී. මේ නිසා 2015 වර්ෂයේ දී සියලුම විෂයමලා සම්බන්ධයෙන් සංශෝධනය කළ යුතු අවධියක් උදා වී ඇත.

ඉහත සඳහන් තත්ත්වය ගැන සලකා 10 ශ්‍රේණිය සඳහා ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂය සම්බන්ධයෙන් කෙටි කාලයට දී ගුරු අත්පොතක් ලියා ඉදිරිපත් කිරීම ගැන මා අතිශයින් ම සතුටු වෙමි.

විශේෂයෙන් ම මෙම කාර්ය සපුරාලීම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කළ ලේඛක මණ්ඩලයට හා මෙම කාර්ය ඉතාමත් සාර්ථක ලෙස නිම කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබා දුන් අධ්‍යක්ෂ ජනරාල්තුමාට, සහකාර අධ්‍යක්ෂ ජනරාල්තුමන්ට හා සහාය දැක්වූ අනෙකුත් සියලුම දෙනාට මගේ හෘදයාංගම ස්තුතිය ඉතා සතුටින් පිරිනමමි.

10 ශ්‍රේණිය සඳහා වූ මෙම ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය ගුරු අත්පොත දරුවන්ට වඩාත් සාර්ථක ලෙස ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා විෂය අධ්‍යක්ෂවරුන්ට, ගුරු උපදේශකවරුන්ට හා ගුරුභවතුන්ට ද මහත් අත්වැලක් වන බව මම තරයේ ම විශ්වාස කරමි.

ආචාර්ය ඒ. සිවනේසරාජා
අධ්‍යක්ෂ,
වාණිජ දෙපාර්තමේන්තුව,
විද්‍යා හා තාක්ෂණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය සම්බන්ධීකරණය : පී.එච්. කුසුමාවතී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
\- වාණිජ දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ලේඛක මණ්ඩලය : **අභ්‍යන්තර**
පී.එච්. කුසුමාවතී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

බාහිර
සිරිමා නානායක්කාර -
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ඇල්පිටිය.
එම්.එච්.එම්. බුහාරි -
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය. කෑගල්ල
සී.එල්.එම්. නවාස් -
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය. ඉබ්බාගමුව

භාෂා සංස්කරණය : එස්.ඒ.ඩී. ගුණපාල
කථිකාචාර්ය, අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
ජාතික අධ්‍යාපන ආයතනය.

ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

වර්ෂ 2015 සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සඳහා ක්‍රියාත්මක වීමට නියමිත ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විෂය නිර්දේශය පදනම්ව 10 ශ්‍රේණිය සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර තිබේ.

සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙන ආකාරයට ඔබගේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම අපේක්ෂා කරමින් ඒ සඳහා ඔබට මගපෙන්වීමක් වශයෙන් මෙහි ආදර්ශ ක්‍රියාකාරකම් ඇතුළත් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත්තේ පන්ති කාමරය තුළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතු අනුපිළිවෙළට ම ය. විෂය නිර්දේශයේ ඇති සෑම නිපුණතා මට්ටමක් සඳහා ම **ඉගෙනුම් ඵල** ඉදිරිපත් කර ඇත. එම ඉගෙනුම් ඵලවලට හා අදාළ නිපුණතා මට්ටමට සියලු ම සිසුන් ළඟා වන ආකාරයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් ඔබ විසින් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂිත ය. ඒ සඳහා ඔබට කරන මගපෙන්වීමක් ලෙස එක් එක් නිපුණතා මට්ටම් යටතේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ඉදිරිපත් කර ඇත. එම උපදෙස් එලෙස ම අනුගමනය කිරීම අනිවාර්ය නොකෙරෙන අතර සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙන ආකාරයේ වෙනත් සුදුසුයැයි හැඟෙන ශිෂ්‍ය කේන්ද්‍රීය වූ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට නිර්මාණශීලී ඔබට පූර්ණ නිදහස ඇත.

එසේ ම සෑම නිපුණතා මට්ටමක් යටතේම , විෂය අන්තර්ගතය සංක්ෂිප්තව , මෙම ගුරු මාර්ගෝපදේශය ඉදිරිපත් කර ඇත. එය ඔබ පන්ති කාමරයේ දී ක්‍රියාකාරකම් තුළින් අනාවරණය කර ගත යුතු හා සිසුන්ට සටහනක් ලෙස ලබාදිය යුතු විෂය කරුණුවලට මගපෙන්වීමක් වන්නේ ය.

පී.එච්. කුසුමාවතී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
වාණිජ දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පටුන	පිටු අංකය
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය	i
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය	ii
හැඳින්වීම	iii
විෂයමාලා කමටුව	iv
ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම උපදෙස්	v
විෂය නිර්දේශය	vi- xix
ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්	1 - 82

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

විෂය නිර්දේශය

10 ශ්‍රේණිය

(2015 සිට ක්‍රයාත්මක වේ)

Fo Pa

හැඳින්වීම

මෙම විෂය නිර්දේශය වර්ෂ 2015 දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම විෂය නිර්දේශය මගින් ශිෂ්‍යයාගේ ඉදිරි පෞද්ගලික දිවි පැවැත්මට අවශ්‍ය මඟපෙන්වීමක් සිදු කිරීමට ඉවහල්වන ව්‍යාපාර දැනුම හා කුසලතා වර්ධනය, පාරිභෝගික දැනුම වර්ධනය, ගනුදෙනු සටහන් කිරීම, ව්‍යාපාර ප්‍රතිඵල ඇගයීම, තොරතුරු තාක්ෂණය, ඉතිරිකිරීම හා ආයෝජනයට නැඹුරු කිරීම, ව්‍යාපාර කළමනාකරණය ආදී අංශ පිළිබඳ ව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමට බලාපොරොත්තු වේ. එමෙන් ම මෙම විෂයය ඉගෙනීමෙන් ව්‍යවසායකයන්, කළමනාකරුවන් සහ වෙනත් වෘත්තිකයන් බිහිකිරීමට මූලික පදනමක් ගොඩනැගෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ තුළින් රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීමට ද අපේක්ෂා කෙරේ.

එමෙන් ම ශිෂ්‍ය කේන්ද්‍රීය නිපුණතා පාදක ක්‍රියාකාරකම් ප්‍රමුඛ ව ශිෂ්‍යයාගේ සමෝධානික පෞරුෂය ගොඩනැගීමට ශික්ෂණ විද්‍යාත්මක එළෙඹුමෙන් බලාපොරොත්තු වේ. ශික්ෂණ විද්‍යාත්මක එළඹුම හා විෂය අන්තර්ගතය වෙනස් කිරීමෙන් වන සංකලනයෙන්, ඉගෙනීමෙන් ප්‍රතිඵල ලබා ජීවිතයේ අවසානය දක්වා ම ඵල ලබන, සමාජයට බරක් නොවන, සමාජ වගකීමෙන් යුතුව කටයුතු කරන, වෙනස්වන ලෝකයේ තත්ත්වයන්ට අනුකලනය විය හැකි පුරවැසියන් බිහිකිරීමට මෙම විෂයමාලාව ඉවහල් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ජාතික පොදු අරමුණු

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව (2003 දෙසැම්බර්)

පොදු නිපුණතා සමූහ

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණය ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(ii) **පෞරුෂත්ව වර්ධනය අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ ඵලදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම.

විෂය අරමුණු

(1) ව්‍යාපාර ආශ්‍රිත වෘත්තීයකට නැඹුරුවීම හෝ තමාගේම ව්‍යවසායක් ආරම්භ කිරීමේ හැකියාව ඇති කිරීමට.

(2) ව්‍යාපාර ගණුදෙනු වාර්තා කිරීමට, පිටපත් කිරීමට හා ව්‍යාපාරයක අවසාන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට.

(3) මනා කළමනාකාරිත්වයක් සහ අවබෝධයකින් යුතුව ව්‍යාපාරයක් පවත්වා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීමට.

(4) සමාජ වගකීම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරන ව්‍යාපාරිකයකු/ පාරිභෝගිකයකු බවට පත් කිරීමට.

(5) ඉලෙක්ට්‍රෝනික ගත වාණිජ්‍ය හා ගිණුම්කරණය පිළිබඳ මූලික හැකියා ලැබීමට.

කාලච්ඡේද වෙන් කිරීම

යෝජිත විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අනුව අ.පො.ස. (සා.පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය සඳහා සතියකට කාලච්ඡේද තුන බැගින් වර්ෂයට කාලච්ඡේද 90 ක් වෙන් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශයට නියමිත වර්ෂ දෙක සඳහා කාලච්ඡේද 180 ක් වෙන් කර තිබේ. විෂය නිර්දේශයේ ඒ ඒ නිපුණතා සඳහා ද, එම නිපුණතා තුළ නිපුණතා මට්ටම් සඳහා ද කාලය වෙන් වශයෙන් දක්වා ඇත. නිපුණතාවලට වෙන් කරන ලද කාලය නිපුණතා මට්ටම්වලට වෙන් කරන ලද කාලයට වඩා වැඩි ය. මින් අදහස් කරන්නේ අමතර කාලය අභ්‍යාස හා ඇගයීම් ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමයි.

තක්සේරුව හා ඇගයීම

පාසල් මට්ටම

පාසල් මට්ටම සඳහා රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය පොදුවේ අනුගමනය කරන තක්සේරු කිරීමේ හා ඇගයීමේ විවිධ ශිල්පීය ක්‍රම මෙම විෂය සඳහා ද අනුගනය කිරීම යෝග්‍ය වේ.

ජාතික මට්ටම

11 වන ශ්‍රේණිය අවසානයේ පැවැත්වෙන ජාතික මට්ටමේ අගයීම් සඳහා දෙනු ලබන ලිඛිත පරීක්ෂණය අදාළ වේ.

නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය හා කාලය - 10 ශ්‍රේණිය

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද
1 wkqoekqfuka hq;=j jHdmdr f,dalhg m%úIag fjhs'	1.1 ව්‍යාපාර පිළිබඳ මූලික පදනමක් ගොඩනගා ගනියි.	• "ව්‍යාපාර" සංකල්පය • ව්‍යාපාර අරමුණු • පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා • භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර • සේවා නිෂ්පාදන ව්‍යාපාර • නිෂ්පාදන සාධක	• ව්‍යාපාර සංකල්පය නිර්වචනය කරයි. • ව්‍යාපාර අරමුණු දක්වයි. • ව්‍යාපාර විසින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරන ආකාරය පැහැදිලි කරයි. • භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා නිෂ්පාදන ව්‍යාපාර සඳහා නිදසුන් සපයයි. • නිෂ්පාදන සාධකවල අවශ්‍යතාව දක්වයි.	**10** 05
	1.2 ව්‍යාපාර කෙරේ ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු ඉටුකිරීමේ මූලික පදනම සකසා ගනියි.	• ඇල්මැති පාර්ශ්වය • ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු	• ව්‍යාපාර කෙරේ ඇල්මැති පාර්ශ්ව නම් කරයි. • එක් එක් ඇල්මැති පාර්ශ්වවල අරමුණු පැහැදිලි කරයි.	05

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද
2' jHdmdr mßirfha n,mEïj,g wkq.; fjñka jHdmdr lghq;= mj;ajd f.k hdug lghq;= lrhs	2.1 රජයේ බලපෑම හා නීතිරීති ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කරයි	• ව්‍යාපාර පරිසර සාධක • රජයේ බලපෑම් • රජයේ නීතිරීති	• ව්‍යාපාරවලට අදාළ පරිසර සාධක අභ්‍යන්තර හා බාහිර වශයෙන් පෙළගස්වයි. • ව්‍යාපාර කෙරේ එල්ලවන රජයේ බලපෑම් සරලව ඉදිරිපත් කරයි. • ව්‍යාපාරවලට බලපාන රජයේ නීතිරීති ඉදිරිපත් කරයි. • රජයේ බලපෑම් හා නීතිරීති මගින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කරන ආකාරය පැහැදිලි කරයි.	**10** 04
	2.2 තාක්ෂණික හා ආර්ථික පරිසරයේ බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කරයි.	• ආර්ථික පරිසර බලපෑම් • තාක්ෂණික පරිසර බලපෑම්	• තාක්ෂණික පරිසර හා ආර්ථික පරිසර බලපෑම් ඉදිරිපත් කරයි. • තාක්ෂණ පරිසර බලපෑම් හා ආර්ථික පරිසර බලපෑම් මගින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කළ හැකි ආකාරය පැහැදිලි කරයි.	03
	2.3 ගෝලීය පරිසරය හා එහි බලපෑම ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කරයි.	• ගෝලීයකරණය • ගෝලීය පරිසරයේ බලපෑම්	• ගෝලීය පරිසර බලපෑම් සරලව ඉදිරිපත් කරයි. • ගෝලීය පරිසර බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව කරන ආකාරය පැහැදිලි කරයි.	03

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද

3. ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා පිළිබඳ මූලික තොරතුරු විමසමින් තමාට සුදුසු ව්‍යාපාර තෝරා ගැනීමට අවශ්‍ය පසුබිම සකසා ගනියි.	3.1 ව්‍යාපාර සංවිධාන වර්ග විමසමින් සුදුසු ව්‍යාපාර තේරීමේ මූලික හැකියා ලබයි.	• ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම
		• ව්‍යාපාර සංවිධාන වර්ග හා මූලික ලක්ෂණ
		  • තනි පුද්ගල ව්‍යාපාර
		  • හවුල් ව්‍යාපාර
		  • සංස්ථාපිත සමාගම්
		  • සමුපකාර
		  • සමිති සංවිධාන
		  • රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු
			• විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග පෙළගස්වයි.
			• තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමුපකාරවල හා සමිති සංවිධානවල වාසි අවාසි සාකච්ඡා කරයි.
			• රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තුවල වාසි අවාසි සාකච්ඡා කරයි.
				10
				
				04

	3.2 යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ මූලික හැකියාව ලබයි.	• අරමුණු අනුව • පරිමාව අනුව • කළමනාකරණය අනුව	• අරමුණු අනුව ව්‍යාපාර තෝරා ගන්නා ආකාරය දක්වයි. • පරිමාව අනුව ව්‍යාපාර තෝරා ගන්නා ආකාරය දක්වයි. • කළමනාකරණය අනුව ව්‍යාපාර තෝරා ගන්නා ආකාරය දක්වයි.	03
	3.3 තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ පියවර අනුගමනය කරයි.	• ලියාපදිංචිය සඳහා අනුගමනය කළ යුතු පියවර • ලියාපදිංචි කිරීමේ ලියවිලි • ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන	• තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කරයි. • තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය පාර්ශ්වයන්ට උපදෙස් දෙයි. • තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දක්වයි.	03

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද

4. ව්‍යාපාර ගණුදෙනු වාර්තා කරයි.	4.1 ව්‍යාපාරයක ගණුදෙනු ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි	• ගිණුම්කරණය
		• ගිණුම්කරණයේ අරමුණ සහ අවශ්‍යතාව
		• ව්‍යාපාර ගණුදෙනු
		• ව්‍යාපාරයක සිදුවන විවිධ ගණුදෙනු
		• එම විවිධ ගණුදෙනු හේතුවෙන් ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම බිහිවන බව.
		• ගිණුම්කරණ සමීකරණයේ පදනම
		• ගිණුම්කරණ සමීකරණය
		  • වත්කම්
		  • වගකීම්
		  • හිමිකම
		• ගිණුම්කරණ සමීකරණ ගොඩනැගීම
		  • බාහිර වගකීම් නොමැති විට
		  • බාහිර වගකීම් ඇති විට
		
		• හිමිකම වෙනස්වන අවස්ථා
		  • අමතර ප්‍රාග්ධනය යෙදීම
		  • ගැනිලි
		  • ආදායම
		  • වියදම
			• " ගිණුම්කරණය" යන්න පැහැදිලි කරයි.
			• ගිණුම්කරණ අරමුණු හා අවශ්‍යතාව දක්වයි.
			• ව්‍යාපාර ගනුදෙනු පැහැදිලි කර නිදසුන් ඉදිරිපත් කරයි.
			• වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් මතුවන ආකාරයේ ගනුදෙනු ඉදිරිපත් කරයි.
			• ගිණුම්කරණ සමීකරණය ඉදිරිපත් කර එහි මූලික සංරචක විස්තර කරයි.
			• බාහිර වගකීම් නොමැති අවස්ථාවල දී ගිණුම්කරණ සමීකරණය ගොඩනගයි.
			• බාහිර වගකීම් ඇති අවස්ථාවල දී ගිණුම්කරණ සමීකරණය ගොඩනගයි.
			• හිමිකම් වෙනස්වීම සිදුවන අවස්ථා නිදසුන් ඇසුරින් පැහැදිලි කරයි.
				20
				10

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද

	4.2 ගනුදෙනුවල ද්විත්ව බලපෑම ද්විත්ව සටහන් ක්‍රමය අනුව සටහන් කරයි.	• ගනුදෙනුවල ද්විත්ව බලපෑම
		• ද්විත්ව සටහන් ක්‍රමය
		• ගිණුම සහ එහි ආකෘතිය
		• ගණුදෙනුවල ද්විත්ව සටහන් :
		  • හර සටහන්
		  • බැර සටහන්
		• ගිණුම් වර්ග
		  • වත්කම්
		  • වගකීම්
		  • ආදායම්
		  • වියදම්
		  • හිමිකම්
			• ගනුදෙනුවක ද්විත්ව බලපෑම දක්වයි.
			• ද්විත්ව සටහන් ක්‍රමය ඉදිරිපත් කරයි.
			• ලෙජරයේ ඇති ගිණුම් වර්ග නම් කරයි.
			• ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
				10

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද

5. මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.	5.1 මුදලින් සිදුවන ගනුදෙනු වාර්තා කිරීම සඳහා මුදල් පොත පවත්වා ගනියි	• මූලික පොත් හා ඒවායේ අවශ්‍යතාව
		• මූලාශ්‍ර ලේඛන
		• මුදල් පොත හා එහි අවශ්‍යතාව
		• මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීම
		  • මුදල් ලැබීම්
		  • මුදල් ගෙවීම්
		• මුදල් ශේෂය
		• මුදල් පොතේ ද්විත්ව කාර්ය
			• මූලික පොත් නම් කර පැහැදිලි කරයි.
			• මූලික පොත්වල අවශ්‍යතාව දක්වයි.
			• මූලාශ්‍ර ලේඛනවල වැදගත්කම පැහැදිලි කරයි.
			• එක් එක් මූලික පොතට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
			• මුදල් පොත විස්තර කර, එහි අවශ්‍යතාව දක්වයි.
			• මුදල් පොතේ ගනුදෙනු සටහන් කරයි.
			• මුදල් පොතේ ද්විත්ව කාර්ය පැහැදිලි කරයි.
			• මුදල් පොතෙන් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
				40
				
				05

	5.2 බැංකු ගනුදෙනු බැංකු ගිණුමේ වාර්තා කරයි.	• මූලාශ්‍ර ලේඛන
		• ගනුදෙනු සටහන් කිරීම
		  • මුදල් තැන්පතු
		  • චෙක්පත් තැන්පතු
		  • චෙක්පත් නිකුත් කිරීම
		  • මුදල් ආපසු ගැනීම
		  • බැංකු අයිරාව
			• බැංකු ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
			• මුදල් තැන්පතු, චෙක්පත් තැන්පතු හා චෙක්පත් නිකුත් කිරීම් බැංකු ගිණුමේ සටහන් කරයි.
			• චෙක්පත් අගරුවීමට හේතු දක්වමින් අගරු චෙක්පත් වාර්තා කරයි.
			• බැංකු ශේෂය ගණනය කරයි.
			• බැංකු අයිරාව පැහැදිලි කරයි.
				04

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද

	5.3 බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරයි.	• බැංකු ප්‍රකාශනය
		• බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ බැංකු ගිණුමේ ශේෂය වෙනස් විය හැකි බව.
		• ශේෂයන් වෙනස්වීමට බලපෑ හැකි හේතු.
		  • නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්
		  • තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්
		  • බැංකු ගාස්තු
		  • ස්ථාවර නියෝග මත බැංකුව කළ ගෙවීම්
		  • සෘජු ප්‍රේෂණ
		• බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම
		• බැංකු ගිණුමේ සංශෝධිත (වාසිදායක) ශේෂය පදනම් කරගත් බැංකු සැසඳුම් ප්‍රකාශනය
			• බැංකු ප්‍රකාශනය පැහැදිලි කරයි.
			• බැංකු ප්‍රකාශනයේ ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය වෙනස්වීමට බලපාන හේතු දක්වයි.
			• බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කරයි.
			• වාසිදායක ශේෂය පදනම්ව බැකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරයි.
				05

	5.4 මුදල් වට්ටම් සම්බන්ධ ගනුදෙනු මුදල් පොතේ සටහන් කරයි.	• මුදල් වට්ටම්
		  • දුන් වට්ටම්
		  • ලද වට්ටම්
		• මූලාශ්‍ර ලේඛන
		• වට්ටම් සහිත ගණුදෙනු සටහන් කිරීම.
		• ලෙජරයට පිටපත් කිරීම
			• මුදල් වට්ටම් පැහැදිලි කරයි.
			• වට්ටම් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
			• වට්ටම් සහිත ගනුදෙනු මුදල් පොතේ සටහන් කරයි.
			• මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
				03

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද

	5.5 සුළු ගෙවීම් සටහන් කිරීමට සුළු මුදල් පොත පවත්වා ගනියි.	• සුළු මුදල් පොතේ අවශ්‍යතාව
		• සුළු මුදල් ගණුදෙනු
		• මූලාශ්‍ර ලේඛන
		• සුළු මුදල් අග්‍රිමය
		• විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොත
		• ගනුදෙනු වාර්තා කිරීම
		  • ප්‍රධාන මුදල් භාරකරුගෙන් අග්‍රිමය ලබා ගැනීම.
		  • සුළු මුදල් ගෙවීම් සටහන් කිරීම.
		  • සුළු මුදල් ශේෂය ගණනය කිරිම.
		  • අග්‍රිමය ප්‍රතිපූර්ණය
		  • ලෙජරයට පිටපත් කිරිම.
			• සුළු මුදල් ගනුදෙනු දක්වයි.
			• සුළු මුදල් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
			• සුළු මුදල් අග්‍රිමය පැහැදිලි කරයි.
			• විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතේ ගනුදෙනු වාර්තා කර ශේෂය ගණනය කරයි.
			• සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කර දක්වයි.
			• සුළු මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
				03

	5.6 ගැණුම් ජර්නලය පිළියෙල කරයි.	• ගැණුම් ජර්නලය • මූලාශ්‍ර ලේඛන • සටහන් කිරීම • ලෙජරයට පිටපත් කිරීම	• ගැනුම් ජර්නලයේ අවශ්‍යතාව දක්වයි. • ගැනුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය නම් කරයි. • ගැනුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කරයි. • ගැනුම් ජර්නලයේ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.	03

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද
	5.7 විකුණුම් ජර්නලය පිළියෙල කරයි.	• විකුණුම් ජර්නලය • මූලාශ්‍ර ලේඛන • සටහන් කිරීම • ලෙජරයට පිටපත් කිරීම	• විකුණුම් ජර්නලයේ අවශ්‍යතා දක්වයි. • විකුණුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි. • විකුණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කරයි. • විකුණුම් ජර්නලයේ ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.	03

	5.8 පොදු ජර්නලයක් පවත්වා ගනියි.	• පොදු ජර්නලය
		• මූලාශ්‍ර ලේඛන
		• සටහන් වර්ග
		  • ගැළපුම් සටහන්
		  • වැරදි නිවැරදි කිරීමේ සටහන්
			• පොදු ජර්නලයේ අවශ්‍යතා දක්වයි.
			• පොදු ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
			• පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග නම් කරයි.
				03

	5.9 ලෙජර් ගිණුම් තුලනය කර ශේෂ පිරික්සුම පිළියෙල කරයි.	• මූලික පොත්වලින් ගණුදෙනු ලෙජරයට පිටපත් කිරීම. • ලෙජර් ගිණුම් තුලනය කිරීම. • ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.	• මූලික පොත්වල ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි. • ලෙජර් ගිණුම් තුලනය කරයි. • ශේෂ පිරික්සුම පිළියෙල කරයි.	03

නිපුණතා	නිපුණතා මට්ටම	අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද
	5.10 ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේ දී හා ලෙජරයේ පිටපත් කිරීමේ දී සිදුවූ වැරදි නිවැරදි කරයි.	• ගණුදෙනු සටහන් කිරීමේ දී සිදුවිය හැකි වැරදි • ශේෂ පිරික්සුම එකගවීමට බලනොපාන වැරදි හා ඒවා නිවැරදි කිරීම • ශේෂ පිරික්සුම එකගවීමට බලපාන වැරදි හා අවිනිශ්චිත ගිණුම ඇසුරින් එම වැරදි නිවැරදි කිරීම	• ගනුදෙනු මූලික පොත්වලට සටහන් කිරීමේ දී සිදුවිය හැකි වැරදි පෙළගස්වයි. • ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී සිදුවිය හැකි වැරදි පෙළගස්වයි. • ශේෂ පිරික්සුමේ සමානත්වයට බලනොපාන වැරදි හඳුනාගෙන නිවැරදි කරයි. • අවිනිශ්චිත ගිණුමේ අවශ්‍යතා දක්වයි. • අවිනිශ්චිත ගිණුම ඇසුරින් වැරදි නිවැරදි කරයි.	06
	5.11 ක්ෂණිකව මුදල් ගනුදෙනු සිදු කිරීම හා ප්‍රතිඵල අනාවරණය කර ගැනීම සඳහා තාක්ෂණික ක්‍රමවේද භාවිත කරයි.	• ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිත කරමින් ගනුදෙනු කිරීම • ජංගම දුරකථන සේවාව ආශ්‍රිත ව්‍යාපාර ගනුදෙනු • පරිගණකය ආශ්‍රිත ව්‍යාපාර ගනුදෙනු • ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිත කරමින් ගනුදෙනු කිරීමේ දී ලැබෙන වාසි • ක්ෂණිකව ගනුදෙනුවක් සිදු කිරීම. • බිල්පත් ගෙවීම වැනි • කෙටි පණිවිඩ සේවාව • ක්ෂණිකව දැනුවත් වීම • අවශ්‍ය උපකරණ ගනුදෙනුකරු වෙත තිබීම	• ජංගම දුරකථන සේවාව ආශ්‍රිත මුදල් ගනුදෙනු කිරීමේ ප්‍රවණතාව පිළිබඳ අදහස් දක්වයි. • ජංගම දුරකථන සේවාව ආශ්‍රිත මුදල් ගනුදෙනු සඳහා නිදසුන් සපයයි. • ඉලෙක්ට්‍රෝනික උපකරණ භාවිතයෙන් ගනුදෙනු කිරීමෙන් ලබා ගත හැකි වාසි දක්වයි.	02
				90

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

නිපුණතාව 1 : අනුදැනුමින් යුතුව ව්‍යාපාර ලෝකයට ප්‍රවිෂ්ට වෙයි.
නිපුණතා මට්ටම 1.1 : ව්‍යාපාර පිළිබඳ මූලික පදනමක් ගොඩනඟා ගනියි.
කාලච්ඡේද : 05

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ළඟාකර ගත හැකි වේ.

- ව්‍යාපාර සංකල්පය පැහැදිලි කිරීමට.
- ව්‍යාපාර අරමුණු දැක්වීමට.
- ව්‍යාපාර විසින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරන ආකාරය පැහැදිලි කිරීමට.
- භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා ව්‍යාපාර සඳහා නිදසුන් දැක්වීමට.
- නිෂ්පාදන සාධකවල අවශ්‍යතා දැක්වීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ව්‍යාපාර

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන හෝ ඒවා සම්පාදනය කිරීමේ කටයුතුවල නියැලී සිටින ආයතන හා සංවිධාන ව්‍යාපාර ලෙස හැඳින්විය හැකිය. විශේෂයෙන් ම මිනිසාට අවශ්‍ය භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කිරීම හෝ ඒවා බෙදාහැරීම සම්බන්ධ කටයුතුවල ව්‍යාපාර නියුතු වේ. ලාභ ඉපයීම ව්‍යාපාරයක ප්‍රධාන අරමුණකි. එහෙත් සමහර ව්‍යාපාර ලාභ ඉපයීම ම අරමුණු කර නොගෙන පවත්වාගෙන යනු ලැබේ. විශේෂයෙන් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සමහර විට ලාභ ඉපයීම ට වඩා සේවා සැපයීම අරමුණු කර ගෙන පවත්වාගෙන යනු ලැබේ. අතීතයේ පැවති ව්‍යාපරවලට වඩා වර්තමානයේ ව්‍යාපාර ඉතා පුළුල් ය. ව්‍යාපර ගනුදෙනු විද්‍යුත් මාධ්‍යයෙන් සිදුකළ හැකි අතර ලෝකයේ ඕනෑම රටක සිට ගනුදෙනු කිරීමේ හැකියාව තිබේ.

ව්‍යාපාරවල අරමුණු

- ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල අයිතිකරුවන්ට ප්‍රමාණවත් ලාභයක් ඉපයීම
- පාරිභෝගික වෙනස්වන වුවමනා සපුරාලීම
- රැකියා උත්පාදනය වැනි දෑ

ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරාගත යුතු දෑ මිනිස් අවශ්‍යතා ලෙස හැඳින්වේ.

නිදසුන්:

ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය හා අධ්‍යාපනය .... ආදිය

අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා වේ.

නිදසුන්:

ආහාර	:	බත්, කඩල, පාන්, බනිස්, මුංඇට, තේ
ඇඳුම්	:	සාරි, කලිසම්, ගවුම්
අධ්‍යාපනය	:	ගුරු සේවය, රජයේ පාසල්, විභාග, පුස්තකාල

අවශ්‍යතා මත ඇතිවන විවිධ වුවමනා ඉටුකර ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ යුතු වේ. නිෂ්පාදන කාර්යය ව්‍යාපාර විසින් ඉටු කරයි. මෙම ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා ව්‍යාපාර ලෙස වර්ග කළ හැකි ය.

නිදසුන්:

භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
ටයර් නිෂ්පාදනය
පාන් නිෂ්පාදනය
ඇඳුම් නිෂ්පාදනය

සේවා ව්‍යාපාර	බැංකු
බාබර් සාප්පු	ගරාජ
ඇඳුම් මැසීම	රෝහල්
තැපැල් කාර්යාල	සිල්ලර වෙළෙඳ ව්‍යාපාර

ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා විවිධ වූ සම්පත් අවශ්‍ය වේ. ඒවා නිෂ්පාදන සාධක ලෙස හැඳින්වේ.

භූමිය	:	ඉඩම්, ස්වභාවික සම්පත්
ශ්‍රමය	:	සේවකයන්, කළමනාකරුවන්
ප්‍රාග්ධනය	:	මුදල්, යන්ත්‍ර, ගොඩනැගිලි යනාදිය
ව්‍යවසාය	:	අයිතිකරු, සංවිධානය කරන්නන්

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

පහත දැක්වෙන පින්තූරය අධ්‍යයනය කිරීමට සිසුන් යොමුකර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලබාගෙන විෂය අන්තර්ගතය මතුවන ආකාරයට සාකච්ඡාවක් කරන්න.

BOC

BANK OF CEYLON

ලංකා බැංකුව இலங்கை வங்கி

ඔබේ විශ්වසනීය බැංකුව

ප්‍රශ්නාවලිය

1. පින්තූරයේ පෙනෙන දේවල් නම් කරන්න.
2. ඒවායින් අපට ලබාගත හැකි දෑ මොනවාද ?
3. ඔබට ඉන් ලබාගත හැකි ප්‍රයෝජන මොනවා ද?
4. පින්තූරයේ දැක්වෙන, ඔබට ජීවත්වීමට අවශ්‍ය දෑ සපයන ස්ථානවලට පොදු නමක් යෝජනා කරන්න.
5. පින්තූරයේ ඇති ව්‍යාපාර ආයතන, සේවා ව්‍යාපාර හා භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපර ලෙස වර්ග කර දක්වන්න.
6. මෙම නිෂ්පාදන ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් මොනවා ද?
7. මෙවැනි ව්‍යාපාර ආරම්භ කිරීමට පදනම් වන හේතු දක්වන්න.
8. ඔබ ප්‍රදේශයේ පවත්නා ව්‍යාපාර පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පෙළපොත - 10 ශ්‍රේණිය ,
  1 වන පාඩම, ව්‍යාපාර පදනම

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

1. ව්‍යාපාරවල අරමුණු හා ආර්ථික කටයුක්ත යන පද ඇතුළත් වන පරිදි ව්‍යාපාර සංකල්පය පැහැදිලි කිරීම.
2. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස නිදසුන් ඇසුරින් දැක්වීම.
3. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා ව්‍යාපාර සඳහා නිදසුන් පහක් සැපයීම.
4. ඉඩම්, යන්ත්‍ර. ගොඩනැගිලි, මුදල්, අයිතිකරුවන්, සේවකයින්, වාතාශ්‍රය, ආලෝකය වැනි ව්‍යාපාර පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත්, නිෂ්පාදන සාධක යටතේ වෙන් කර දැක්වීම.
5. පින්තූර ඇසුරින් අරමුණට අදාළ තොරතුරු රැස් කිරීම.
6. ඉදිරිපත්වීමේ හැකියාව ලැබීම

නිපුණතාව 1 : අනුදැනුමින් යුතුව ව්‍යාපාර ලෝකයට ප්‍රවිෂ්ට වෙයි.

නිපුණතා මට්ටම 1.2 : ව්‍යාපාර කෙරේ ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු ඉටුකිරීමේ මූලික පදනම සකසා ගනියි.

කාලච්ඡේද : 05

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව නම් කිරීමට.
- එක් එක් ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු පැහැදිලි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ව්‍යාපාර කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්ව ඇල්මැති පාර්ශ්ව ලෙස හැඳින්වේ. එනම්,

- අයිතිකරු/ අයිතිකරුවන්
- කළමනාකරුවන්
- සේවකයන්
- සැපයුම්රුවන්
- තරගකරුවන්
- ණයදෙන ආයතන/ පුද්ගලයන්
- පාරිභෝගිකයෝ
- බැංකු හා මූල්‍ය ආයතන
- රජය
- ප්‍රජාව

ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු

මෙම ඇල්මැති පාර්ශ්වයන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන්නේ ඒ ඒ පාර්ශ්වයන්ගේ විවිධ වූ අරමුණු ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙනි. පහත වගුවෙන් එම අරමුණු ඉදිරිපත් කර තිබේ.

පාර්ශ්වය	අරමුණු
1. අයිතිකරු	• ප්‍රමාණවත් ලාභයක් ලැබී ඇත් ද යන්න හා • කීර්තිනාමයක් ලබා තිබේ ද යන්න විමසීම
2. කළමනාකරුවන්	• කළමනාකරණ කටයුතු සාර්ථක වී ඇත් ද යන්න හා • කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කළ හැකි ද යන්න විමසීම
3. සේවකයින්	• රැකියාව සුරක්ෂිත වී ඇත් ද යන්න හා • සුදුසු වැටුපක් ලබාගත හැකි ද යන්න විමසීම
4. ගනුදෙනුකරුවෝ	• ගුණාත්මක බවින් යුතු භාණ්ඩ හා සේවා ලබා ගත හැකි ද? • ඉතා ඉක්මණින් හා පහසුවෙන් භාණ්ඩ හා සේවා ලබා ගත හැකි ද? • සාධාරණ මිලක් තිබේ ද?
5. සැපයුම්කරුවෝ	• තමන් සපයන භාණ්ඩ සඳහා නිසි පරිදි මුදල් ලබා ගැනීම
6. ණයදෙන ආයතන	• දෙන ලද ණය නැවත ලබා ගැනීමට හැකි ද? • තවදුරටත් ණය ලබාදිය හැකි ද?
7. බැංකු හා මූල්‍ය ආයතන	• තම ආයතනය සමඟ ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීම. • ණය හා වෙනත් සේවා සැපයීමට
8. රජය	• පාරිභෝගිකයින් සුරක්ෂිත වන ලෙස ව්‍යාපාරය පවත්වා ගන්නේ ද? • රජයට ලැබිය යුතු බදු ආදායම නිසි ලෙස ගෙවන්නේ ද?
9. ප්‍රජාව	• සමාජයට ව්‍යාපාරයෙන් වන සේවාව පිළිබඳ අවධානය යොමු කිරීම. • ව්‍යාපාරයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අවධානය යොමු කිරීම.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

ඇල්මැති පාර්ශ්වයන් වෙන් වෙන් වශයෙන් ද, ඔවුන්ගේ අරමුණු වෙන් වෙන් වශයෙන් ද, පන්තියේ සිටින සියලු සිසුන්ට ලැබෙන ආකාරයට අදාළ ප්‍රමාණය තීරණය කර කාඩ්පත්වල හෝ ලියන කඩදාසි තීරුවල ලියා ගන්න.

නිදසුන් : පහත සඳහන් පරිදි word cards සකස් කර ගන්න.

අයිතිකරු	බැංකු	අයිතිකරු
ගනුදෙනුකරුවකු ලෙස බැංකුව සම්බන්ධ කර ගැනීම.	කීර්තිනාමය ලබා තිබේ ද?	
කීර්තිනාමය ලබා තිබේ ද?	අයිතිකරු	බැංකු

ප්‍රමාණවත් words cards සංඛ්‍යාවක් සකස් කරගන්න.

- එක් පාර්ශ්වයක් නමින් තීරු කිහිපයක් සකස් කරගත හැකි ය.
- එම කඩදාසි තීරු මිශ්‍ර කර පෙට්ටියක බහාලන්න.
- සිසුන්ට එම කඩදාසි තීරු උචිත පරිදි ලබා දෙන්න.
- ඇල්මැති පාර්ශ්ව හා ඊට අදාළ අරමුණු සහිත words cards අතැති සිසුන් මූණ ගැස්සීමට උපදෙස් දෙන්න.
- එම මුණගැසීම නිවැරදි දැයි සොයා බලා විෂය කරුණක් ලෙස සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට අනෙක් සිසුන් ඇතැති තීරුවල ඇතුළත් තොරතුරු සටහන් කර ගැනීමට සිසුන් යොමු කරන්න.
- ''ව්‍යාපාර කෙරේ ඇල්මැති පාර්ශ්ව හා ඔවුන්ගේ අරමුණුවලට අදාළව'' නිවැරදිව සටහනක් ගොනුවී ඇත්දැයි සොයා බලන්න.
- ඇල්මැති පාර්ශ්ව හා ඔවුන්ගේ අරමුණු ගැළපෙන පරිදි ඉහත ක්‍රීඩාව ඔබට උචිත පරිදි සිදු කරන්න.
- ඇල්මැති පාර්ශ්ව හා ඔවුන්ගේ අරමුණු ගැළපෙන ලෙස වගුවක හිස්තැන් පිරවීමට හෝ නිවැරදි ලෙස යා කිරීමට හෝ සුදුසු අභ්‍යාසයක් සකස් කර දෙන්න.
- පාසලක්/ රෝහලක්/ සමුපකාරයක්/ වෙළෙඳහලක් වැනි ආයතනයක් නම් කර, එම ආයතනය කෙරෙහි ඇල්මැති පාර්ශ්ව හා ඔවුන්ගේ ඊට අදාළ අරමුණු පෙළගැස්මට සිසුන් යොමු කරන්න.

- විෂය අන්තර්ගතය මතුවන ආකාරයට සාකච්ඡාවක් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  1 වන පාඩම, ව්‍යාපාර පදනම

තක්සේරුව හා ඇගයීම යෝජිත උපදෙස් :

1. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව නිදසුන් ඇසුරින් නම් කිරීම.
2. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන්ගේ අරමුණු නිදසුන් දක්වමින් ඉදිරිපත් කිරීම.
3. එක් ආයතනයක් නම් කර ඒ හා සම්බන්ධ ඇල්මැති පාර්ශ්ව නම් කිරීම.
4. අන් අය සමඟ තොරතුරු සාකච්ඡා කර තමන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.

නිපුණතාව 2 : ව්‍යාපාර පරිසරයේ වෙනස්වීම්වලට අනුගතවෙමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යයි.

නිපුණතා මට්ටම 2.1 : රජයේ බලපෑම් හා නීතිරීති ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කරයි.

කාලච්ඡේද : 04

සුවිශේෂ ඉගෙනුම් ඵල :

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ව්‍යාපාර පරිසර සාධක අභ්‍යන්තර හා බාහිර වශයෙන් පෙළ ගැස්වීමට.
- ව්‍යාපාරවලට අදාළ රජයේ බලපෑම් සරලව ඉදිරිපත් කිරීමට.
- ව්‍යාපාරවලට අදාළ රජයේ නීති රීති සරලව ඉදිරිපත් කිරීමට.
- රජයේ බලපෑම් හා නීතිරීති මගින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කරන ආකාරය පැහැදිලි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී බලපෑම්වලට එල්ල වන විවිධ සාධක ඇතුළත් පරිසරය ව්‍යාපාර පරිසරය ලෙස හැඳින්වේ. ව්‍යාපාර පරිසරය, අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

ව්‍යාපාර පරිසරය

- අභ්‍යන්තර පරිසර සාධක
  - අයිතිකරුවෝ
  - සේවකයෝ
  - කළමනාකරුවෝ
- බාහිර පරිසර සාධක
  - රජයේ බලපෑම් හා නීතිරීති
  - තාක්ෂණික පරිසරය
  - ආර්ථික පරිසරය
  - ගෝලීය පරිසරය

රජයේ බලපෑම් හා නීතිරීති

මෙහිදී ව්‍යාපාර කෙරෙහි රජයේ මැදිහත්වන ආකාරය අනුව ව්‍යාපාරවලට විවිධ ලෙස බලපෑම් ඇතිවේ. එනම්,

- යටිතල පහසුකම් සැපයීම. (විදුලිය, මාර්ග තැනීම, ජලය ලබාදීම.)
- පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම.
- ව්‍යාපාර ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබාදීම.
- සේවක සුරක්ෂිතතාව සඳහා කටයුතු කිරීම.

(වැටුප් තීරණය කිරීම, සේවා කාලය, නිවාඩු තීරණය කිරීම වැනි දේ.)
රජයේ බලපෑම් හා නීතිරීති හේතුවෙන් ව්‍යාපාර අයිතිකරුවන්ට තම අභිමතය පරිදි කටයුතු කිරීමේ සීමා ඇතිවේ. අනෙක් අතට රජය විසින් ව්‍යාපාරවලට අවශ්‍ය විවිධ පහසුකම් සපයන බැවින් ව්‍යාපාර දියුණු කර ගැනීමට අවස්ථාව සලසා තිබේ.

නිදසුන් : විදුලිය, මහාමාර්ග වැනි පහසුකම් ලබාදීම නිසා ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කර ගැනීමට ඉවහල් වී ඇත.

පාරිභෝගිකයින් ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත පිහිටුවා ඇත. නිදසුන් : යම් ව්‍යාපාරයක් වංචා සහගත ලෙස පාරිභෝගිකයකු නොමග යැවූ විට එම පනතට අනුව නඩු පවරනු ලැබේ.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පෙළපොත භාවිතයෙන් හෝ ඔබ සපයන තොරතුරු ගොනුවකින් විවෘත ග්‍රන්ථ පරීක්ෂණයක් මගින් විෂය කරුණු මතුකර දෙන්න.
- මෙහිදී පෙළපොතේ ව්‍යාපාර පරිසරය යටතේ ඇති ව්‍යාපාර පරිසර වර්ග කිරීම, දේශපාලන හා නෛතික පරිසරයට අදාල විෂය කරුණු හොඳින් අධ්‍යයනය කිරීමට ඉඩ සලස්වන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර පහත සඳහන් මාතෘකා දෙක අහඹු ලෙස බෙදා දී එක් එක් මාතෘකාවට එක් ප්‍රශ්නාවලියක් බැගින් සකස් කරවන්න.
  - ව්‍යාපාර පරිසරය වර්ග කිරීම
  - දේශපාලන හා නෛතික පරිසරය

- ඒ ඒ කණ්ඩායමෙන් පිළිතුරු ගවේෂණාත්මකවලබා ගැනීමට ඉඩකඩ සලස්වා දෙන්න.

- ප්‍රශ්නාවලියෙන් ලබාගත් පිළිතුරු පෙළපොත හා ඔබ විසින් ලබාදෙන තොරතුරු අනුව සනාථ කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් විසින් ලියන ලද පිළිතුරු නිවැරදි දැයි පරීක්ෂා කර අපහසුතා දක්වන සිසුන් සඳහා ප්‍රතිපෝෂණ ද අනෙක් සිසුන් සඳහා ඉදිරි පෝෂණ ද ලබා දෙන්න.
- නිවැරිදි විෂය කරුණු ඇතුළත් වන සේ සටහනක් සිසුන්ට ලබා දෙන්න
- විෂය කරුණු හා ඉගෙනුම් ඵල ආවරණය වන පරිදි" උචිත මාතෘකාවක් යටතේ පන්ති බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කර ප්‍රදර්ශනය කර ඇගයීමට ලක් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 වසර ,
  2 වන පාඩම, ව්‍යාපාර පරිසරය

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ව්‍යාපාර පරිසර සාධක දැක්වීම
- ව්‍යාපාර කෙරෙහි බලපාන රජයේ නීතිරීති දැක්වීම
- ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට රජයේ නීතිරීති බලපාන ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කිරීම.
- ස්වයං අධ්‍යයනයෙන් අවශ්‍ය තොරතුරු වෙත ළඟා වීම.

නිපුණතාව 2 : ව්‍යාපාර පරිසරයේ වෙනස්වීම්වලට අනුගතවෙමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යයි.

නිපුණතා මට්ටම 2.2: තාක්ෂණික හා ආර්ථික පරිසර බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කරයි.

කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල :

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- තාක්ෂණික හා ආර්ථික පරිසර බලපෑම් ඉදිරිපත් කිරීමට.
- තාක්ෂණික පරිසර බලපෑම් හා ආර්ථික පරිසර බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කළ යුතු ආකාරය පැහැදිලි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ආර්ථික පරිසරය හැඳින්වීම

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී බලපෑම් ඇතිවීමට තුඩු දෙන, උද්ධමනය, පොළී අනුපාත, වැටුප්, ආදායම්, ඉතිරිකිරීම්, ආයෝජන, බදු ප්‍රතිශත, විනිමය අනුපාත වැනි විචල්‍යයන් ඇතුළත් පරිසරය ආර්ථික පරිසරයයි.

තාක්ෂණික පරිසරය හැඳින්වීම

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී බලපෑම් ඇතිවීමට තුඩුදෙන නව තාක්ෂණික උපකරණ, යන්ත්‍රසූත්‍ර , නව ක්‍රමවේද, නව සොයා ගැනීම් යනාදිය ඇතුළත් පරිසරය තාක්ෂණික පරිසරය ලෙස හැඳින්වේ.

ආර්ථික හා තාක්ෂණික පරිසර සාධක නිසා ව්‍යාපාරවලට වන බලපෑම්

පරිසර සාධකයේ විචල්‍ය	බලපෑම්
ආර්ථික පරිසරය • පොළී අනුපාත • භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් වෙනස්වීම • භාණ්ඩ මත බදු පැනවීම	• පොළී අනුපාත අඩු කිරීම නිසා ව්‍යාපාරවලට ණය ලබා ගැනීම සඳහා වැඩියෙන් පෙලඹේ. එම අවස්ථාව ව්‍යාපාර සංවර්ධනයට යොදා ගැනීම. • මිල මට්ටම් ඉහළයෑම නිසා ව්‍යාපාර වියදම, වැඩිවේ. එවිට වියදම් පාලනය කිරීමට කටයුතු කරයි. • භාණ්ඩ මත බදු පැනවීමෙන් ව්‍යාපාර වියදම් ඉහළ යා හැකි ය.
තාක්ෂණික පරිසරය • නව යන්ත්‍ර සූත්‍ර සොයා ගැනීම හා භාවිතය • ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණුවීම • සන්නිවේදන තාක්ෂණය දියුණුවීම • නිෂ්පාදන ක්‍රම භාවිතය	• වැඩි නිෂ්පාදනයන් කළ හැකිවීම • ඉහළ ගුණත්වයෙන් යුතු නිමවුම් බිහිවීම • උපරිම ලාභය කරා යාහැකිවීම. • කාලය ඉතිරිවීම. • ගුණත්වය ආරක්ෂාවීම • මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව කළ හැකිවීම. • පාරිභෝගිකයින් ඇද ගැනීම • වෙළෙඳාම වැඩිවීම මෙවැනි යහපත් බලපෑම් මෙන්ම අයහපත් බලපෑම් ද ඇතිවේ.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- ආර්ථික හා තාක්ෂණික පරිසර සාධකවලට අයත් විචල්‍යයන්, එක් කාඩ්පතක එක් විචල්‍යයක් බැගින් ලියා සිසුන් අතර බෙදා දෙන්න.

  නිදසුන් : | වැටුප් වැඩි කිරීම | | ව්‍යාපාරය භාවිත කරන පරිගණකය යල් පැනීම | | නිෂ්පාදන ක්‍රම භාවිතය |

- පෙළපොත අධ්‍යයනයට යොමු කරන්න.
- කාඩ්පතේ ඇතුළත් විචල්‍යය නිසා ව්‍යාපාරවලට වන බලපෑම එම කාඩ්පත තුළ හෝ පිටුපස ලිවීමට හෝ අභ්‍යාසය පොතේ ලිවීමට උපදෙස් දෙන්න.

- සිසුන් ලියා ඇති පිළිතුරු සාකච්ඡා කරමින් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර සටහනක් ලෙස ලබා දෙන්න.
- පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න කිහිපයක් සකස් කර සිසුන්ට පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

- 2013 ජනවාරි මස සිට බැංකු පොළී අනුපාතය 2% කින් ඉහළ දැමීමට තීරණය කර ඇත. මේ නිසා ව්‍යාපාරවලට වන බලපෑම දැක්වෙන වඩාත්ම නිවැරදි පිළිතුර වන්නේ,
  1. ව්‍යාපාර විසින් ණය ගැනීමට පෙලඹේ.
  2. ව්‍යාපාර විසින් මෙම මුදල් බැංකු ගිණුමේ තැන්පත් කරයි.
  3. ව්‍යාපාර විසින් ණය ගැනීම සීමා කිරීම.
  4. භාණ්ඩ හා සේවාවල විකුණුම් මිල ඉහළ දැමීම

- වගා බිම්වල සිට වෙළෙඳපොළ දක්වා නිෂ්පාදන බෙදාහැරීම සඳහා යොදාගත හැකි නව ක්‍රමවේදයක් සඳහා නිදසුනක් ඉදිරිපත් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 වසර ,
  2 වන පාඩම - ව්‍යාපාර පරිසරය

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- තාක්ෂණික පරිසර බලපෑම් විස්තර කිරීම.
- ආර්ථික පරිසර බලපෑම් විස්තර කිරීම.
- තාක්ෂණික පරිසරය බලපෑම් සඳහා නිදසුන් පහක් දැක්වීම.
- ආර්ථික පරිසර බලපෑම් සඳහා නිදසුන් පහක් දැක්වීම.
- අධ්‍යයනයෙන් නව තොරතුරු වෙත ළඟා වීම.

නිපුණතාව 2 : ව්‍යාපාර පරිසරයේ වෙනස්වීම්වලට අනුගතවෙමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යයි.

නිපුණතා මට්ටම 2.3: ගෝලීය පරිසරය හා එහි බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීමට කටයුතු කරයි.

කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල :

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ගෝලීය පරිසර බලපෑම් සරලව ඉදිරිපත් කිරීමට.
- ගෝලීය පරිසර බලපෑම් ඇසුරින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කරන ආකාරය පැහැදිලි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ගෝලීය පරිසරය හැඳින්වීම

ලෝකයේ විවිධ රටවල් අතර පැවති සීමාවන් හා බාධක ඉවත් වී මුළු ලෝකය ම එක ම ගම්මානයක් ලෙස කටයුතු කිරීම ගෝලීය පරිසරය ලෙස සරලව හැඳින්විය හැකිය. එබැවින් ලෝකය විශ්ව ගම්මානයක් ලෙස සැලකේ. සන්නිවේදන තාක්ෂණයේ දියුණුව, ප්‍රවාහන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් වර්තමානයේ ලෝකය ම විශ්ව ගම්මානයක් ලෙස කටයුතු කරයි.

ගෝලීය පරිසරයේ බලපෑම්

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වෙනස්වීම් හා නව සොයා ගැනීම් හේතුවෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී හිතකර හා අහිතකර ලෙස බලපෑම් ඇතිවේ.

නිදසුන් :

- ජාත්‍යන්තර ලෙස ප්‍රසිද්ධියට පත් ආයතනවල භාණ්ඩ හා සේවා දේශීය වෙළෙඳ පොළට ලඟාවීම නිසා දේශීය ව්‍යාපාර දියුණු වීම.
- දේශීය වශයෙන් ක්‍රියාත්මක වන නිෂ්පාදන ආයතනවල පැවැත්මට බලපෑමක් වීම.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- සුදුසු සම්පත් පුද්ගලයකු ගෙන්වා ගෝලීය පරිසරය ව්‍යාපාරයට බලපාන ආකාරය පැහැදිලි කිරීමට ඉඩ සලස්වන්න. (විනාඩි 30-45 අතර)
- ඒ සඳහා මගපෙන්වීමට දේශකයාට උචිත තොරතුරු ලබා දෙන්න. එනම්

නිදසුන් :
- ගෝලීය පරිසරය හැඳින්වීම
- ව්‍යාපාර භාණ්ඩ හා සේවා සඳහා වෙළෙඳපොළ සොයා ගැනීම.
- ඇණවුම් කිරීම, මිලට ගැනීම විකිණීම නිදහස්ව සිදුවන අයුරු
- මුදල් ගෙවීම් කිරීම

- දේශීය කුඩා ව්‍යාපාර හා එයට වන බලපෑම් ගෝලීය පරිසරය ඇසුරින් සිදුවන ආකාරය පැහැදිලි කිරීමට යොමු කරවන්න.

- එම දේශනය අවසන් වූ පසු මාතෘකාවට අදාළ ඉගෙනුම් ඵල සංවර්ධනය වන පරිදි විෂය කරුණු සිසුන් සමඟ සාකච්ඡා කරමින් සරල සටහන් සිසුන්ට ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 වසර,

2 වන පාඩම - ව්‍යාපාර පරිසරය

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ගෝලීයකරණය නිදසුන් මගින් පැහැදිලි කිරීම
- ගෝලීය පරිසර සාධක මගින් ව්‍යාපාරවලට කරන බලපෑම දැක්වීම.
- නිෂ්පාදන ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපාරවලට ගෝලීය පරිසරය නිසා සිදුවිය හැකි බලපෑම නිදසුන් ඇසුරින් පැහැදිලි කිරීම
- ගෝලීය පරිසරය නිසා ව්‍යාපාරවලට කරන හිතකර හා අහිතකර බලපෑම් නිදසුන් මගින් දැක්වීම

නිපුණතාව 3 : ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා පිළිබඳ මූලික තොරතුරු විමසමින් තමාට සුදුසු ව්‍යාපාර තෝරා ගැනීමට අවශ්‍ය පහසුකම් සකසා ගනියි.

නිපුණතා මට්ටම 3.1 : ව්‍යාපාර සංවිධාන වර්ග විමසමින් සුදුසු ව්‍යාපාර තේරීමේ මූලික හැකියා ලබයි.

කාලච්ඡේද : 04

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග පෙළගැස්වීමට.
- තනි පුද්ගල ව්‍යාපාරයක වාසි අවාසි සාකච්ඡා කිරීමට.
- හවුල් ව්‍යාපාරයක වාසි අවාසි සාකච්ඡා කිරීමට.
- සංස්ථාපිත සමාගමක වාසි අවාසි සාකච්ඡා කිරීමට.
- සමුපකාරයක වාසි අවාසි සාකච්ඡා කිරීමට.
- සමිති සංවිධානවල වාසි අවාසි සාකච්ඡා කිරීමට.
- රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය දෙපාර්තමේන්තුවල වාසි අවාසි සාකච්ඡා කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

තනි පුද්ගල ව්‍යාපාර

ව්‍යාපාර අයිතිය තනි පුද්ගලයකු සතු වන ව්‍යාපාර තනි පුද්ගල ව්‍යාපාර හෙවත් කේවල ස්වාමි ව්‍යාපාර ලෙස හඳුන්වයි.

තනි පුද්ගල ව්‍යාපාරවල සුවිශේෂී ලක්ෂණ	වාසි	අවාසි
1. ප්‍රාග්ධනය අයිතිකරු විසින් යෙදවීම 2. බලපවත්වන නීතිරීති අවම වීම 3. ලාභය තනිව භුක්ති විඳීම 4. අයිතිකරුගේ වගකීම අසීමිත වීම 5. නීතිමය පුද්ගල භාවයක් නොමැතිවීම 6. ස්ථාපිත කිරීමේ නිර්ණායක නැතිවීම 7. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම 8. ලියාපදිංචිය අනිවාර්ය නොවීම 9. ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව	1. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම 2. ස්වයං පාලනය 3. සියලුම ලාභ අයිතිකරු සතුවීම 4. ව්‍යාපාර තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම 5. කැපවීම 6. කළමනාකරණ කටයුතු තනිවම තීරණය කිරීම 7. තම දක්ෂතා උපරිමව යෙදවීම 8. ලාභය තනිව භුක්ති විඳීම	1. අයිතිකරුගේ වගකීම අසීමිත වීම 2. ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා පැවතීම 3. අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම 4. ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම 5. අයිතිකරු තනිව ගන්නා තීරණ සමහර විට අසාර්ථක වීම 6. අවදානම තනිව දැරීම

හවුල් ව්‍යාපාර

ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක් පොදුවේ කරගෙන යන, පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයකි. (ලාභ ඉපයීමේ අරමුණින් ව්‍යාපාර පවත්වාගෙන යන දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් අතර පවත්නා පොදු ව්‍යාපාර හවුල් ව්‍යාපාරයකි.)

හවුල් ව්‍යාපාරවල සුවිශේෂී ලක්ෂණ	වාසි	අවාසි
1. හවුල්කරුවන් අවම සංඛ්‍යාව 2 කි. උපරිම 20 කි. 2. හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනය සපයයි 3. හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතීම. 4. වගකීම අසීමිතය 5. ලියාපදිංචිය අනිවාර්ය නොවේ 6. නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම 7. අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම	1. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම 2. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි ය. 3. හවුල්කරුවන්ගේ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි ය. 4. වගකීම් හවුල්කරුවන් අතර බෙදී යයි. 5. සාමූහික තීරණ ගත හැකි ය.	1. වගකීම් අසීමිත වීම 2. ලාභය පුද්ගලයන් කීපදෙනෙකු අතර බෙදී යයි. 3. අඛණ්ඩ පැවැත්මක් නැතිවීම 4. මතභේද ඇතිවිය හැක. 5. නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම

හවුල් ගිවිසුම -

හවුල් කරුවන් විසින් එකඟ වන්නාවූ කරුණුවලට අදාළ ව සකස් කර ගන්නා ලිඛිත ලියවිල්ල හවුල් ගිවිසුම නැතහොත් හවුල් ඔප්පුවයි. එමගින් හවුල්කරුවන් අතර ඇතිවිය හැකි ගැටුම් හා මතභේද අවම කර ගත හැකි ය.

සංස්ථාපිත සමාගම්

සංස්ථාපිත සමාගමක් යනු ව්‍යාපාරයට ප්‍රාග්ධනය යොදන ලද අයිතිකරුවන්ගෙන් වෙන්වූ , අඛණ්ඩ පැවැත්මක් ඇති, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ආරම්භ කරන ලද ව්‍යාපාර සංවිධානයකි.

සංස්ථාපිත සමාගමක සුවිශේෂ ලක්ෂණ	වාසි	අවාසි
1. සමාගම් පනත යටතේ ආරම්භ කිරීම. 2. අඛණ්ඩ පැවැත්මක් තිබීම 3. නෛතික පුද්ගලභාවයක් හිමිවීම 4. වගකීම සීමිත වීම 5. කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය යෙදීම.	1. ප්‍රාග්ධනය විශාල ප්‍රමාණයක් රැස්කර ගත හැකිවීම. 2. නෛතික පුද්ගලභාවයක් හිමිවීම 3. අඛණ්ඩ පැවැත්මක් තිබීම 4. වගකීම සීමාසහිත වීම 5. සාපේක්ෂව වැඩි පිළිගැනීමක් හිමිවීම.	1. නීතිමය බලපෑම් වැඩිවීම 2.විසුරුවා හැරීම පහසු නොවීම. 3.අයිතිය පාලනයෙන් බැහැරවීම. 4.බදු ගෙවීමට සිදුවීම.

සමුපකාර

සාමාජිකයින්ගේ සුභසාධනය සඳහා සමුපකාර පනත යටතේ ලියාපදිංචි කරන පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි.

සමුපකාරවල සුවිශේෂ ලක්ෂණ	වාසි	අවාසි
1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම 2. විවෘත හා ස්වෙච්ඡා සාමාජිකත්වය 3. සාමාජිකයන්ගේ සාමූහික අයිතිය 4. පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්තවීම	1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම 2. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලකට ලබාදීම 3. විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාර කටයුතු කළ හැකි වීම 4. අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම	1. මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම 2. සමුපකාර ප්‍රතිපත්ති මත ම ක්‍රියා කළ යුතුවීම 3. දේශපාලන ඇඟිලි ගැසීම් පැවතීම.

සමිති සංවිධාන

ලාභ ඉපයීමේ අරමුණින් තොරව විශේෂයෙන් සාමාජිකයින්ට හා සමාජයට ද යහපතක් සලසන අරමුණු ඇතිව සාමාජිකයින් විසින් පිහිටුවා ගනු ලබන සංවිධාන සමිති සංවිධාන නමින් හැඳින්වේ.

නිදසුන් :
- මරණාධාර සමිති
- ක්‍රීඩා සමිති
- පුණ්‍යායතන

සමිති සංවිධානවල ලක්ෂණ	වාසි	අවාසි
1. ලියාපදිංචිය අනිවාර්යය නොවීම	1. පහසුවෙන් ඇරඹිය හැකිවීම	1. වංචා සිදුවීමට ඇති ඉඩකඩ වැඩිවීම
2. පහසුවෙන් ආරම්භ කළ හැකිවීම 3. සාමාජික සුභසාධනය අරමුණු කර ගත් කටයුත්තක් වීම	2. සාමාජිකයන්ට ප්‍රයෝජනවත් වීම	

රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු

අයිතිය රජය සතු වූ විශේෂ පනත් මගින් පිහිටුවා ඇති ආයතන රාජ්‍ය සංස්ථා වේ.

නිදසුන් :
- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- පොල් සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

රාජ්‍ය සංස්ථාවල සුවිශේෂ ලක්ෂණ	වාසි	අවාසි
• අයිතිය හා පාලනය රජය සතුවීම • පොදුවේ සේවා සැපයීමේ අරමුණින් පිහිටුවීම • වගකීම රජය සතුවීම • නෛතික පුද්ගලභාවයක් හිමිවීම • ලියාපදිංචිය අනිවාර්ය වේ. • අඛණ්ඩ පැවැත්මක් තිබීම	• අත්‍යාවශ්‍ය සේවා සඳහා උචිතවීම • සුභසාධනය පදනම් වීම	• බොහෝවිට පාඩු ලබමින් පවත්වාගෙන යාම • අකාර්යක්ෂම පාලනය නිසා පරිපාලනය අපහසුවීම • දේශපාලන බලපෑම් අධිකවීම • ආරම්භ කිරීම අපහසුවීම

දෙපාර්තමේන්තු

මුළුමණින්ම රජයේ අයිතිය හා පාලනය යටතේ පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවන ලද ආයතන දෙපාර්තමේන්තු වේ.

නිදසුන් :
- විභාග දෙපාර්තමේන්තුව
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- දුම්රිය සේවා දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුවල සුවිශේෂ ලක්ෂණ	වාසි	අවාසි
• අයිතිය හා පාලනය රජය සතුවීම • රජයේ වගකීම අසීමිතවීම • ලියාපදිංචිය අනිවාර්ය වීම • අඛණ්ඩ පැවැත්මක් තිබීම • නීතිමය පුද්ගලභාවයක් නැත.	• අත්‍යවශ්‍ය සේවා සඳහා යොදා ගැනීම • මහාපරිමාණ සේවා සැපයිය හැකි වීම • රජයේ සේවක පිරිස් සිරීම • සැමට සමානව සැලකීම	• පාලනය අපහසුවීම • නීතිරීති වැඩිවීම • පහසුවෙන් ඇරඹිය නොහැකිවීම • බොහෝවිට පාඩු ලැබීම • සේවයේ නියුතු සේවකයන් අධික වීම • භාණ්ඩ හිගකම/ බදු සඳහා ව්‍යාප්ත නොවේ.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පෙළපොතේ විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ පාඩම තුළ ඇතුළත් ලක්ෂණ වාසි හා අවාසි යන විෂය කරුණු අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
    - තනි පුද්ගල ව්‍යාපාර
    - හවුල් ව්‍යාපාර
    - සංස්ථාපිත සමාගම්
    - සමුපකාර හා සමිති සමාගම්
    - රාජ්‍ය
    - රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු

- මාතෘකා අහඹු ලෙස කණ්ඩායම්වලට බෙදා දෙන්න. දෙන ලද කාර්ය පත්‍රිකාවේ සඳහන් කළ යුතු තොරතුරු පෙළ පොත භාවිතයෙන් රැස් කරවන්න

- කාර්ය පත්‍රිකාවේ සඳහන් කළ යුතු ව්‍යාපාරයේ නම, එක් එක් කණ්ඩායමට ලැබෙන ව්‍යාපාර වර්ගයට ගැලපෙන ව්‍යාපාර නාමයක් විය යුතු බව සිසුන්ට පැහැදිලි කරන්න.

කාර්ය පත්‍රිකාව

.... ව්‍යාපාරය
(1) ඉහත ව්‍යාපාර හඳුන්වන්න.
(2) මෙම ව්‍යාපාරයේ මූලික ලක්ෂණ පෙළගස්වන්න.
(3) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.
(4) ඔබ විසින් රැස්කර ගත් තොරතුරු සුදුසු ආකාරයට පන්තියට ඉදිරිපත් කරන්න.

අභ්‍යාස

- සිසුන් ඉදිරිපත් කළ තොරතුරුවල නිවැරදි බව තහවුරු කරගත් පසු උචිත සටහන් ගොඩනඟා සිසුන්ට ලබා දෙන්න.
- පහත වගුව සම්පූර්ණ කරන්න.

	තනිපුද්ගල ව්‍යාපාර	හවුල් ව්‍යාපාර	සංස්ථාපිත සමාගම්	සමුපකාර	සමිති සංවිධාන	රාජ්‍ය සංස්ථා	රාජ්‍ය දෙපා.
			----------				
1. අයිතිකරු	----------	----------	----------	----------		----------	----------
2. පාලනය	----------	----------	----------	----------	----------	----------	----------
3. පැවැත්ම	----------	----------	----------	----------	----------	----------	----------
4. වගකීම්	----------	----------		----------	----------	----------	----------
5. නෛතික			----------		----------		
පුද්ගලභාවය	----------	----------	----------	----------		----------	----------
6. ලියාපදිංචිය	----------	----------	----------	----------	----------	----------	----------
7. ප්‍රාග්ධනය සැපයීම	----------	----------	----------	----------	----------	----------	----------
8. වාසි 1.	----------	----------	----------	----------	----------	----------	----------
2.	----------	----------	----------	----------	----------	----------	----------
	----------	----------	----------	----------	----------	----------	----------
9. අවාසි 1	----------	----------		----------	----------	----------	----------
					----------		

- ඔබ ප්‍රදේශයේ ඇති සිල්ලර වෙළෙඳසළක් හා සමුපකාර සමිතියක් අතර පවත්නා වෙනස්කම් ඉදිරිපත් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය,
  3 වන පාඩම - ව්‍යාපාර සංවිධාන

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා සංස්ථාපිත සමාගම්වල විශේෂ ලක්ෂණ නම් කිරීම.
- සමුපකාරවල සුවිශේෂතා ලක්ෂණ පෙළගැස්වීම
- රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තුවල සුවිශේෂතා ලක්ෂණ පෙළගැස්වීම
- ඒ ඒ ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ සැසඳීම.
- කාර්ය පත්‍රිකාවක් මගින් අවශ්‍ය තොරතුරු සැපයීම

නිපුණතාව 3 : ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා පිළිබඳ මූලික තොරතුරු විමසමින් තමාට සුදුසු ව්‍යාපාර තෝරා ගැනීමට අවශ්‍ය පහසුකම් සකසා ගනියි.

නිපුණතා මට්ටම 3.2: යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ මූලික හැකියා ලබයි.

කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- අරමුණු අනුව ව්‍යාපාර තෝරා ගන්නා ආකාරය දැක්වීමට .
- පරිමාව අනුව ව්‍යාපාර තෝරා ගන්නා ආකාරය දැක්වීමට .
- කළමනාකරණය අනුව ව්‍යාපාර තෝරා ගන්නා ආකාරය දැක්වීමට .

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් පදනම් වන අරමුණු දෙකකි.
  (1) ලාභ ලැබීමේ අරමුණු
  නිදසුන්: සිල්ලර ව්‍යාපාර

  (2) සමාජික සුභසාධන අරමුණු
  නිදසුන්: ග්‍රාමීය සුභසාධන සංගමය
  බෞද්ධ සංගමය
  මරණාධාර සමිතිය

- ව්‍යාපාරයේ ස්වභාවය අනුව, ව්‍යාපාරිකයාගේ කැමැත්ත හා ව්‍යාපාරිකයාට සපයා ගත හැකි සම්පත් අනුව ආරම්භ කරන ව්‍යාපාරයේ පරිමාව, සුළු පරිමාණ හෝ මහා පරිමාණ ව්‍යාපාරයක් විය හැකි ය. තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන පුද්ගලයෙකුට විශාල සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය නොවේ. සුළු පරිමාණයෙන් ආරම්භ කරන ව්‍යාපාරයක් වුවද මහා පරිමාණයේ ව්‍යාපාරයක් දක්වා වර්ධනය කර ගත හැකි ය.
- ව්‍යාපාරයේ කළමනාකරණය අයිතිකරු වූ තමන් විසින් ම හෝ කිහිපදෙනෙකු විසින් ද සිදු කළ හැකි ය. ඒ අනුව තමා විසින් තෝරා ගන්නා ව්‍යාපාරය කුමක් ද යන්න තීරණය කළ හැකිය.
  (රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් තෝරා ගැනීම මෙහිදී සාකච්ඡා නොකෙරේ.)

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

ඔබ ප්‍රදේශයේ තෝරාගත් ව්‍යාපාරිකයකු හෝ ව්‍යාපාරිකයින් කිහිපදෙනෙකු ගෙන්වා ඔවුන්ගේ ව්‍යාපාරයේ ස්වභාවය, ව්‍යාපාරික අභිමතය, ව්‍යාපාරයේ නම, ව්‍යාපාරය පිහිටි ස්ථානය ව්‍යාපාරය ආරම්භ කිරීමේ අරමුණ, ආරම්භක අවස්ථාවේ දී ව්‍යාපාරයේ පරිමාව හා වර්තමාන තත්ත්වය, ව්‍යාපාරය ආරම්භ කරන අවස්ථාවේ පාලනය කළ ආකාරය හා වර්තමාන පාලන තත්ත්වය පිළිබඳ තොරතුරු මතුවන පරිදි සිසුන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
එසේ නැත්නම් උචිත පරිදි ඉහත කරුණු මතු කරවන්න.

- සාකච්ඡා කිරීමෙන් පසු පහත සඳහන් ආකාරයේ කාර්ය පත්‍රිකාවක් සිසුන්ට ලබා දී අවශ්‍ය තොරතුරු අනාවරණය කර ගන්න.

ඔබට ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවස්ථාවක් උදා වී ඇත.

1. ඔබ විසින් ආරම්භ කිරීමට අදහස් කරන ව්‍යාපාරය නම් කරන්න.
2. ඔබගේ ව්‍යාපාරයට අදාළ අරමුණු නම් කරන්න.
3. ආරම්භ කරන අවස්ථාවේ සුළු පරිමාණයේ ව්‍යාපාරයක්ද, මහා පරිමාණ ව්‍යාපාරයක්ද, යන්න දක්වන්න. පිළිතුරට හේතු පැහැදිලි කරන්න.
4. ඔබගේ ව්‍යාපාරය පාලනය කරන ආකාරය විස්තර කරන්න.

- කාර්ය පත්‍රිකාවෙන් අනාවරණය කරගත් තොරතුරු අපේක්ෂිත විෂය කරුණු සමඟ ගලපමින් සිසුන්ට පැහැදිලි කිරීමක් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය,
  3 වන පාඩම - ව්‍යාපාර සංවිධාන

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

1. ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී පදනම් කර ගන්නා කරුණු පෙළගැස්වීම.
2. ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී පදනම් කර ගන්නා අරමුණු දැක්වීම.
3. සුළු පරිමාණ ව්‍යාපාරයක් තෝරා ගැනීමට පදනම් වන හේතු තුනක් දැක්වීම.
4. පහත දැක්වෙන ව්‍යාපාර පාලනය කරන ආකාරය දැක්වීම.
   - තනි පුද්ගල ව්‍යාපාර
   - හවුල් ව්‍යාපාර
   - සංස්ථාපිත සමාගම්
   - සමුපකාර
   - සමිති සංවිධාන

නිපුණතාව 3 : ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා පිළිබඳ මූලික තොරතුරු විමසමින් තමාට සුදුසු ව්‍යාපාර තෝරා ගැනීමට අවශ්‍ය පහසුකම් සකසා ගනියි.

නිපුණතා මට්ටම 3.3: තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ පියවර අනුගමනය කරයි.

කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- තනි පුද්ගල ව්‍යාපාර ලෙස ආරම්භ කළ හැකි විවිධ ව්‍යාපාර සඳහා නිදසුන් සැපයීමට.
- ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කිරීමට.
- තනි පුද්ගල ව්‍යාපරයක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය පාර්ශ්වවලට උපදෙස් දීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර

(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අදාළ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම.

(2) එම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීම

(3) සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය ප්‍රදේශීය ලේකම් කාර්ලයට භාරදීම.

(4) අදාළ සුදුසුකම් සපුරා ඇත්නම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපාර නාමය ලියාපදිංචි සහතිකය ලබාදීම.

තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන

- ව්‍යාපාරයට අනන්‍යතාවක් ලැබීම
- නීතිමය පිළිගැනීමක් ලැබීම
- බැංකු ණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අයදුම් පත්‍රයක ඡායා පිටපත් සිසුන් අතර බෙදා දී එහි ඇතුළත් විස්තර සිසුන්ට පෙන්වන්න.
- ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර අයදුම් පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ව්‍යාපාරය ලියාපදිංචි සහතිකය ලබා ගත යුතු බව සිසුන්ට ප්‍රකාශ කරන්න.
- පහසුකම් ඇත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරියකු පන්ති කාමරයට ගෙන්වා මෙම පියවර සියල්ල සිසුන්ට ඉදිරිපත් කිරීමට සැලසුම් කරන්න.
- ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට අදාළ ව අනුගමනය කළ යුතු පියවර පෙළගස්වන්න.
- පහසුවෙන් ලබා ගත හැකි තනි පුද්ගල ව්‍යාපාරයක සැබෑ ලියාපදිංචි සහතිකයක පිටපතක් සිසුන්ට ප්‍රදර්ශනය කර පෙන්වන්න

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  3 වන පාඩම - ව්‍යාපාර සංවිධාන

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

1. තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ හැකි ව්‍යාපාරයක් සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම.
2. තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පෙළගැස්වීම.
3. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ප්‍රයෝජන ඉදිරිපත් කිරීම.
4. තමා ආරම්භ කිරීමට කැමති ව්‍යාපාර සඳහන් කිරීම.

නිපුණතාව 4 : ව්‍යාපාරයක ගනුදෙනු වාර්තා කරයි.
නිපුණතා මට්ටම 4.1 : ව්‍යාපාරයක ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි.
කාලච්ඡේද : 10

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- " ගිණුම්කරණය" යන්න පැහැදිලි කිරීමට.
- ගිණුම්කරණ අරමුණු හා අවශ්‍යතාව දැක්වීමට.
- ව්‍යාපාර ගනුදෙනු පැහැදිලි කර, නිදසුන් ඉදිරිපත් කිරීමට.
- වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් මතුවන ආකාරයේ ගනුදෙනු ඉදිරිපත් කිරීමට.
- ගිණුම්කරණ සමීකරණය ඉදිරිපත් කර, එහි මූලික සංරචක විස්තර කිරීමට.
- බාහිර වගකීම් නොමැති අවස්ථාවල දී ගිණුම්කරණ සමීකරණය ගොඩනැගිමට.
- හිමිකම් වෙනස්වීම සිදුවන අවස්ථා නිදසුන් ඇසුරින් පැහැදිලි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ගිණුම්කරණය

- ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කර නිසි පරිදි වර්ග කර, මූල්‍ය වාර්තා පිළියෙල කර අවශ්‍ය පාර්ශ්වවලට තොරතුරු ලබාදීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය වේ.

ගිණුම්කරණයේ අරමුණ

- ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම, ගිණුම්කරණයේ මූලික අරමුණ වේ.

ගිණුම්කරණයේ අවශ්‍යතාව

1. ව්‍යාපාරයක් සතු සීමිත සම්පත් පාලනයකින් යුතුව පවත්වා ගැනීම.
2. ව්‍යාපාරික ගනුදෙනු සටහන් කිරීම තුළින් අමතකවීම් හෝ අතපසුවීම් අවම කරගත හැකිවීම
3. ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය තත්ත්වය හා මූල්‍ය තත්ත්වය මැන බැලීම.
4. ආදායම් බදු ගෙවීම් වැනි නීතිමය අවශ්‍යතාවන් සපුරාලීම.
5. ඉදිරි ව්‍යාපාරික කටයුතු සැලසුම් කර පවත්වා ගැනීම.

ව්‍යාපාර ගනුදෙනු සඳහා නිදසුන්

උදා:
- නැවත විකිණීම සඳහා රු. 15000 කට භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.
- මාසයක් ගතවීමෙන් පසුව මුදල් ගෙවීමේ පොරොන්දුව මත ආසිරි වෙළෙඳහලෙන් රු. 50000 ක භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.

ව්‍යාපාරයක සිදුවන විවිධ ගනුදෙනු හේතුවෙන් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් ඇති වේ.

වත්කම්

ව්‍යාපාර ගනුදෙනු නිසා ඇතිවන, ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ලබාදෙන ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කම් වේ. මේවා ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස තව දුරටත් වර්ග කළ හැකිය

උදා: ගොඩනැගිලි, මෝටර් රථ, භාණ්ඩ තොගය, මුදල් ආදිය

වගකීම්

ව්‍යාපාරය විසින් බාහිර පාර්ශ්වයන්ට ගෙවීමට ඇති බැඳීම් හෙවත් ණය වගකීම් ලෙස හැඳින්වේ. මේවා ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස තව දුරටත් වර්ග කළ හැකිය

නිදසුන් : A ගේ ව්‍යාපාරයට රු. 50000 ක බැංකු ණයක් ලබා ගැනීම.

හිමිකම්

ව්‍යාපාරයේ වත්කම්වලින් අයිතිකරුට හිමි ප්‍රමාණය හිමිකම වේ. ව්‍යාපාරයේ මුළු වත්කම්වලින් මුළු වගකීම් අඩු කළ විට හිමිකම ලැබේ.

නිදසුන් : A විසින් රු. 100000 යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම. මෙහි A ගේ **හිමිකම්** හෙවත් ප්‍රාග්ධනය රු. 100,000 කි.

ආදායම්

ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතුවලින් වන ඉපයීම් ආදායම් ලෙස හැඳින්වේ.

නිදසුන් : A ගේ ව්‍යාපාරයේ

අත්පිට විකුණුම් රු. 70000

ණයට විකුණුම් රු. 50000

වියදම් :

ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේ දී ආදායම් ඉපයීමට දායක වූ වටිනාකම වියදම් ලෙස හැඳින්වේ.

නිදසුන් : සේවක වැටුප් රු. 4000

රක්ෂණ ගාස්තු 1000

ප්‍රචාරණ වියදම් 500

ව්‍යාපාරික ගනුදෙනුවලින් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකමට වන බලපෑම

උදා: 01. 2013.3.1 දින සපුමල් බණ්ඩාර රු. 200000 යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම.

- ව්‍යාපාරය ආරම්භ කිරීමට රු. 200 000 යෙදවීම තුළින් "**හිමිකමක්**" ඇති වීම. (මුළු ප්‍රාග්ධනය වේ.)
- ඒ සමගම ව්‍යාපාරයකට රු. 200 000 මුදලක් ලැබීම. එය **වත්කම්** වේ.

02. 2013.3.2 දින නැවත විකිණීම සඳහා චතුනී වෙළෙඳහළෙන් රු. 50000 ක භාණ්ඩ තොගයක් ණයට මිලදී ගැනීම.

- විකිණීමට මිලදී ගත් භාණ්ඩ තොගය, ව්‍යාපාරයේ **වත්කමකි.**
- චතුනී වෙළෙඳහළට ගෙවීමට ඇති රු. 50000 ව්‍යාපාරයේ **වගකීමකි.**

03. 2013.3.03 භාණ්ඩ විකිණීමෙන් රු. 35000 ක මුදල් ලැබීම

- විකිණීමෙන් ලැබූ රු. 35000 මුදල, මුදල් ලෙස ගත් විට, **වත්කමකි.**
- විකුණුම් ලෙස රු. 35000 ගත් විට, එය **ආදායම කි.**

04. 2013.03.04 සේවක වැටුප් ලෙස රු. 4000 ක් ගෙවීම

- වැටුප් ලෙස ගෙවූ රු. 4000, ව්‍යාපාරයේ **වියදමකි.**
- ඒ සමඟ රු. 4000 මුදලක් අඩුවීම, **වත්කම් අඩුවීමකි.**

ගිණුම්කරණ සමීකරණය

ව්‍යාපාරයක සිදුවන මුදලින් මැනිය හැකි ගනුදෙනුවල බලපෑම් දෙකක් පවතී. එය ද්විත්ව බලපෑම ලෙස හැඳින්වේ. එම ද්විත්ව බලපෑම සටහන් කිරීමට සමීකරණයක් ගොඩනගා ගත හැකි ය. එය ගිණුම්කරණ සමීකරණයයි.

ගිණුම්කරණ සමීකරණයේ සංරචක

1. වත්කම්
2. වගකීම්
3. හිමිකම්

ගිණුම්කරණ සමීකරණය ගොඩනැගීම

- ව්‍යාපාරයකට අයිතිකරු පමණක් සම්පත් යොදා ඇති විට, ගිණුම්කරණ සමීකරණය

වත්කම් = හිමිකම් (ප්‍රාග්ධනය)

ධනංජය විසින් රු. 100,000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කිරීම

ගිණුම්කරණ සමීකරණය

වත්කම්	=	ප්‍රාග්ධනය
100,000	=	100,000
(මුදල්)		(ප්‍රාග්ධනය)

- ව්‍යාපාරයකට, අයිතිකරු හා බාහිර පාර්ශ්වයන් විසින් සම්පත් යොදා ඇති විට ගිණුම්කරණ සමීකරණය,

වත්කම් = හිමිකම් (ප්‍රාග්ධනය) + වගකීම්

ධනංජය විසින් ආරම්භ කළ ව්‍යාපාරයට රු. 50,000 ක බැංකු ණයක් ගැනීම.

ගිණුම්කරණ සමීකරණය

වත්කම්	=	හිමිකම් (ප්‍රාග්ධනය)	+ වගකීම්
150000	=	100000	+ 50000
(මුදල්)		(ප්‍රාග්ධනය)	(බැංකු ණය)

"හිමිකම" වෙනස්වන අවස්ථා

- අමතර ප්‍රාග්ධනය යෙදවීම
- ගැනිලි
- ආදායම්
- වියදම්

අමතර ප්‍රාග්ධනය මුදලින් යෙදූ විට ගිණුම්කරණ සමීකරණය

- වත්කම් (මුදල්) වැඩිවේ.
- හිමිකම් (ප්‍රාග්ධනය) වැඩිවේ.

උදා: සපුමල් බණ්ඩාර විසින් ආරම්භ කළ ව්‍යාපාරයේ තොරතුරු

2013.3.1 රු. 200000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම

2013.3.5 ලොතරැයි දිනුමකින් ලැබුණු මුදලින් රු. 40000 ක් ද ව්‍යාපාරයේ යෙදවීම.

දිනය	වත්කම්		=	හිමිකම් (ප්‍රාග්ධනය)	
2013.03.01	මුදල්	200000		ප්‍රාග්ධනය	200000
2013.03.05	මුදල්	40000		ප්‍රාග්ධනය	40000
		240000			240000

2013.03.05 දිනට ගනුදෙනුවල බලපෑමෙන් පසු වටිනාකම් පහත පරිදි වේ.

වත්කම්	=	හිමිකම් (ප්‍රාග්ධනය)
රු. 240000	=	රු. 240000

"ගැනිලි" ගිණුම්කරණ සමීකරණය තුළ දැක්වීම

" ව්‍යාපාරයේ හිමිකරු ව්‍යාපාරයේ සතු මුදල්, භාණ්ඩ තොග හෝ වෙනත් වත්කම් තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගැනීම ගැනිලි වේ. ගැනිලි සිදුවූ විට,

- වත්කම් අඩුවේ
- හිමිකම් අඩුවේ

උදා: 2013.3.5 දිනට ව්‍යාපාරයේ වත්කම් රු. 240,000 හිමිකම්වල එකතුව ද රු. 240 000 වේ.
2013.3.8 අයිතිකරු වන සපුමල් ධනංජය පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයේ
රු. 5000 ගැනීම.

මෙම ගනුදෙනුව නිසා සමීකරණයට වන බලපෑම පහත පරිදි වේ.

දිනය	වත්කම් =	හිමිකම් (ප්‍රාග්ධනය)
2013.3.5	240000	240000
3-8	මුදල් 5000	ගැනිලි 5000
	235000	235000

2013.03.08 දින සිදුවූ ගනුදෙනුවේ බලපෑමෙන් පසු වටිනාකම් පහත පරිදි වේ.

වත්කම්	=	හිමිකම් (ප්‍රාග්ධනය)
රු. 235000	=	රු. 235000

"ආදායම්" ගිණුම්කරණ සමීකරණය තුළ දැක්වීම

- අත්පිට විකුණුම්, ණයට විකුණුම්, කොමිස් ලැබීම්, පොලී ලැබීම්, ආයෝජන ආදායම් යනාදිය ආදායම් වේ. ආදායම් හේතුවෙන් ව්‍යාපාරයේ,
  - වත්කම් වැඩිවේ
  - හිමිකම් (ප්‍රාග්ධන) වැඩිවේ.

උදා: 2013.03.08 දිනට ව්‍යාපාරයේ වත්කම්වල එකතුව රු. 235000 ද,
හිමිකම්වල එකතුව රු. 235000 වේ. එම ව්‍යාපාරයේ සිදුවී ඇති ගනුදෙනු කිහිපයක් පහත සඳහන් වේ.

2013.03.10 අත්පිට විකුණුම්වලින් රු. 15000 ලැබුණා.

2013.3.12 ණයට විකුණුම් රු. 20000 කි. 2013.03.14 පොලී ආදායම් රු. 4000 ක් ලැබුණා.

ඉහත ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණය සමීකරණයෙන් දැක්වූ විට,

දිනය	වත්කම් =	හිමිකම් (ප්‍රාග්ධනය)
2013.3.08	235000 →	235000
2013.3.10	(මුදල්) + 15000	(විකුණුම් ආදායම)+ 15000
2013.3.12	(ණයගැති) + 20000	(විකුණුම් ආදායම) + 20000
2013.3.14	(මුදල්) + 4000	පොලී ආදායම් + 4000
	රු. 274000	274000

"වියදම්" ගිණුම්කරණ සමීකරණය තුළ දැක්වීම

ගිණුම්කරණ කාලච්ඡේදය තුළදී ආදායම බිහිකරලීමට දායක වූ වියදම් වන වැටුප් ගෙවීම්, රක්ෂණ ගාස්තු, ප්‍රචාරණ වියදම්, ගොඩනැගිලි කුලී ආදී වියදම් මුදලින් ගෙවූ විට

වත්කම් අඩුවේ.

හිමිකම් (ප්‍රාග්ධනය) අඩුවේ

නිදසුන් : ඉහත ව්‍යාපාරයේ 2013.3.14 දිනට වත්කම් රු. 274000 ක් ද හිමිකම් (ප්‍රාග්ධනය) රු. 274000 ද වේ. ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

2013.3.15 වැටුප් ගෙවීම් රු. 6000

ප්‍රචාරණ ගෙවීම් රු. 14000

ඉහත ගනුදෙනුවල වටිනාකම ගිණුම්කරණ සමීකරණයකට ආදේශ කළ විට

දිනය	**වත්කම්**	=	**හිමිකම් (ප්‍රාග්ධනය)**
2013.3.14	27400	=	274000
2013.3.15	මුදල් - 6000	=	වැටුප් - 6000
	මුදල් - 14000	=	ප්‍රචාරණය - 14000
	254000	=	254000

ආදායමෙන් එම ආදායම ඉපයීමට අදාළ වියදම අඩු කළ විට ලාභය හෝ අලාභය ගණනය කරයි. එසේ ගණනය කළ ලාභය හෝ අලාභය ප්‍රාග්ධනයට ගලපනු ලැබේ.

අභ්‍යාස :

2013 අප්‍රේල් මාසයේ සමන්ගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

2013.04.01 : ප්‍රාග්ධනය රු. 200 000

2013.4.20 රු. 50 000 ක් වටිනා තොගය මිලදී ගැණුම්

2013.4.3 රු. 25 000 ක් වටිනා ගොතයක් ණයට ගැණුම්

2013.4.4 රු. 10000ක භාණ්ඩ මිලදී ගැණුම්

2013.4.5 අත්පිට විකුණුම් රු. 75 000

3013.4.6 රු. 50000 ක් වටිනා පරිගණකයක් මිලදී ගැනීම

2013.4.15 රු. 20000 ක් වටිනා තොගය රු. 25 000 කට ණයට විකිණීම

2013.4.16 ප්‍රචාරණ වියදම් රු. 2000 ක්

විදුලිය වියදම් රු. 1000
වැටුප් 5000

2013.4.20 - කොමිස් ආදායම රු. 2500

2013.4.25 - බැංකු ණය වාරිකයක් ගෙව්වා 20000

2013.4.20 - රු. 5000 ක ගැනිලි

2013.4.25 - ලී බඩු උපකරණ ගැනීම රු. 12000

2013.4.26 - රු. 150000 ක් වටිනා අයිතිකරුගේ මෝටර් බයිසිකලය ව්‍යාපාරයට යෙදීම.

(1) ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ දැක්වීම

වත්කම්			=	ප්‍රාග්ධනය			+ වගකීම්
1. මුදල්		200000	=	200000			
2. තොගය	+	50000	=	....			
මුදල්	-	(50000)					
3. තොගය	+	25000	=	....		+	25000 (ණයහිමියෝ)
4. මුදල්	+	100000	=			+	100000 (බැංකු ණය)
5. මුදල්	+	75000	=	විකුණුම්	+	75000	....
6. පරිගණකය	+	50000	=	....		+	....
මුදල්	-	50000					
7. තොගය	-	20000	=	ලාභය	+	5000	....
ණයගැතියෝ	+	25000					
8. මුදල්	-	8000	=	ප්‍රචාරණය	-	(2000)	
				විදුලිය	-	(1000)	
				වැටුප්	-	(5000)	
9. මුදල්	+	2500	=	ලද කොමිස්	+	2500	....
10. මුදල්	-	20000	=	....		-	- 20000 (බැංකු ණය)
11. මුදල්	-	5000	=	ගැනිලි	-	5000	
12. මුදල්	-	12000	=				
ලීබඩු	+	12000	=				
13. මෝටර්-බයිසිකලය	+	150000	=	අමතර ප්‍රාග්ධනය	+	150000	....
		524500	=		+	419500	105000

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- ඔබ පාසලේ ආපනශාලාව/ සමුපකාරය/ බාහිරව ඇති සිල්ලර වෙළෙඳසලක සිදුවූ ගනුදෙනු ඇසුරින් වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- පෙළපොත ද පරිශීලනය කර එම සංරචකවලට අදාළ ගනුදෙනුව බැගින් ගොඩනගන්න.
- පෙළපොත ද පරිශීලනය කර එම ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ සටහන් කිරීමට මඟපෙන්වන්න.

- **මෙවැනි ආකාරයේ ව්‍යාපාරවල ගනුදෙනු සිදුවූ ආකාර රාශියක් ඉදිරිපත් කර අභ්‍යාස වල නිරත කරවන්න.**
- ගිණුම්කරණය හැඳින්වීමේ සිට ගිණුම්කරණ සමීකරණයේ ගනුදෙනු සටහන් කිරීම දක්වා අදාළ විෂය කරුණු හා සිසුන් තුළ සංවර්ධනය කළ යුතු ඉගෙනුම් ඵල මතුවන ආකාරයට පාඩම් කිහිපයක් එම නිපුණතා මට්ටම සඳහා යොදා ගන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය,
  4 වන පාඩම - ව්‍යාපාර ගනුදෙනු වාර්තා කිරීම

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

1. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ දැක්වීම.

2. ව්‍යාපාරයක සිදුවිය හැකි ගනුදෙනු කිහිපයක් ගොඩනගා ගෙන ඒවා ගිණුම්කරණ සමීකරණයේ දැක්වීම.
3. පහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ සංරචකවලට කරන බලපෑම වෙන් වෙන්ව දැක්වීම.
   - රු. 50000 භාණ්ඩ තොගයක් මුදලට ගැනීම.
   - රු. 10000 ක භාණ්ඩ තොගය රු. 12000 කට ණයට විකිණීම
4. බාහිර වගකීම් ඇති අවස්ථාවල දී ගිණුම්කරණ සමීකරණය ගොඩනගා පෙන්වීම.
5. ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු තුනක් නම් කර, ඒවා හිමිකමට බලපාන ආකාරය ලියා දැක්වීම.

නිපුණතාව 4 : ව්‍යාපාරයක ගනුදෙනු වාර්තා කරයි.

නිපුණතා මට්ටම 4.2: ගනුදෙනුවල ද්විත්ව බලපෑම ද්විත්ව සටහන් ක්‍රමය අනුව සටහන් කරයි.

කාලච්ඡේද : 10

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ගනුදෙනුවක ද්විත්ව බලපෑම දැක්වීමට.
- ද්විත්ව සටහන් ක්‍රමය ඉදිරිපත් කිරීමට.
- ලෙජරයේ ඇති ගිණුම් වර්ග නම් කිරීමට.
- ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ගනුදෙනුවල ද්විත්ව බලපෑම

ඕනෑම ගනුදෙනුවක ද්විත්ව බලපෑමක් තිබේ. එය මෙසේ දැක්විය හැකි ය.

ගනුදෙනුව	ද්විත්ව බලපෑම
1. ප්‍රාග්ධනය යෙදීම	මුදල් වත්කම වැඩිවීම ප්‍රාග්ධනය (හිමිකම) වැඩිවීම
2. බඩු තොගයක් මිලට ගැනීම	තොග වත්කම වැඩිවීම මුදල් වත්කම අඩුවීම
3. බැංකු ණය ගැනීම	මුදල් වත්කම වැඩිවීම බැංකු ණය වගකීම වැඩිවීම
4. විකුණුම් ආදායම ලැබීම	මුදල් වත්කම වැඩිවීම විකුණුම් ආදායම් වැඩිවීම
5. සේවක වැටුප් ගෙවීම	වැටුප් වියදම වැඩිවීම මුදල් වත්කම් අඩුවීම
6. අයිතිකරු මෝටර් රථයක් ව්‍යාපාරයට ගෙනඒම	මෝටර්රථ වත්කම වැඩිවීම ප්‍රාග්ධනය/ හිමිකම වැඩිවීම
7. ගැනිලි ලෙස මුදල් ලබා ගැනිම	ප්‍රාග්ධනය අඩුවීම මුදල් වත්කම අඩුවීම
8. බැංකු ණය ආපසු ගෙවීම	බැංකු ණය වගකීම අඩුවීම මුදල් වත්කම අඩුවීම
9. බඩුතොග ණයට විකුණුම්	විකුණුම් ආදායම වැඩිවීම ණයගැති වත්කම වැඩිවීම
10. බඩුතොග ණයට ගැනීම	බඩුතොග වත්කම වැඩිවීම ණයහිමි වගකීම් වැඩිවීම

ද්විත්ව සටහන් ක්‍රමය

ගනුදෙනුවක ද්විත්ව ප්‍රතිඵලය ගිණුම්වල "හර" හා "බැර" වශයෙන් සටහන් කිරීම ද්විත්ව සටහන් ක්‍රමය නම් වේ. ගිණුම්වල ගනුදෙනු සටහන් කළ යුත්තේ පහත දැක්වෙන ආකාරයටයි.

එනම්,

1. හිමිකම වැඩිවීම	ප්‍රාග්ධන ගිණුම්	බැර
හිමිකම අඩුවීම	ප්‍රාග්ධන ගිණුම්	හර
2. වගකීම් වැඩිවීම	වගකීම් ගිණුම්	බැර
වගකීම් අඩුවීම	වගකීම් ගිණුම්	හර
3. වත්කම් වැඩිවීම	වත්කම් ගිණුම්	හර
වත්කම් අඩුවීම	වත්කම් ගිණුම්	බැර
4. වියදම් වැඩිවීම	වියදම් ගිණුම්	හර
වියදම් අඩුවීම	වියදම් ගිණුම්	බැර
5. ආදායම් වැඩිවීම	ආදායම් ගිණුම්	බැර
ආදායම් අඩුවීම	ආදායම් ගිණුම්	හර

ගිණුම හා එහි ආකෘතිය

ගනුදෙනුවල වෙනස්වීම් පිටපත් කරන ආකෘතිය ගිණුම නම් වේ. ව්‍යාපාරයක ගිණුම් වර්ග 5කි.

1. වත්කම් ගිණුම්
2. වගකීම් ගිණුම්
3. හිමිකම් ගිණුම්
4. ආදායම් ගිණුම්
5. වියදම් ගිණුම්

ලෙජරය

ලෙජර ගිණුම් සියල්ල ඇතුළත් කරන පොත ලෙජරයයි .

ගිණුමක ආකෘතිය

.... ගිණුම

හර							බැර
දිනය	විස්තරය	ස පි.	මුදල රු.	දිනය	විස්තරය	ස පි.	මුදල රු.

ගනුදෙනුවේ ද්විත්ව සටහන

ඕනෑම ගනුදෙනුවකින් සිදුවන ද්විත්ව බලපෑමට අදාළ ද්විත්ව සටහන ගිණුම්වල "හර" හා "බැර" වශයෙන් සටහන් කරයි.

ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් තැබීමඃ

ගනුදෙනුව	ද්විත්ව සටහන
1. ප්‍රාග්ධනය යෙදීම රු. 50000	මුදල් ගිණුම හර 50000 ප්‍රාග්ධන ගිණුම බැර 50000
2. බඩුතොගයන් මිලට ගැනීම රු. 12000	ගැනුම් ගිණුම හර 12000 මුදල් ගිණුම බැර 12000

සැලකිය යුතුයි

ද්විත්ව බලපෑම දැක්වීමේ දී තොග වත්කම වැඩි වුවද, ද්විත්ව සටහන් තැබීමේ දී තොග මිලදී ගැනීම තොග ගිණුමට නොව ගැණුම් ගිණුමට පිටපත් කරයි. එනම්, තොගය මිලට ගත් අවස්ථාවේ දී වත්කමකි. තොගය පසුව විකුණන බැවින් විකුණන තෙක් ගැණුම් ගිණුමක පිටපත් කරයි.

3. බැංකු ණය ගැනීම රු. 60000	මුදල් ගිණුම හර 60000 බැංකු ණය ගිණුම බැර 60000
4. විකුණුම් ආදායම රු. 50000 ක් ලැබීම	මුදල් ගිණුම හර 50000 විකුණුම් ගිණුම බැර 50000
5. සේවක වැටුප් ගෙවීම රු. 3000	වැටුප් ගිණුම හර 3000 මුදල් ගිණුම බැර 3000
6. අයිතිකරු රු. 100000 වටිනා තම මෝටර් රථය ව්‍යාපරයට යෙදීම	මෝටර් රථ ගිණුම හර 100000 ප්‍රාග්ධන ගිණුම බැර 100000
7. මුදල් ගැනිලි රු. 1000	ගැනිලි ගිණුම හර 1000 මුදල් ගිණුම බැර 1000
8. බැංකු ණය ගෙවීම රු. 1000	බැංකු ණය ගිණුම හර 10000 මුදල් ගිණුම බැර 10000
9. ණයට විකුණුම් රු. 20000	ණයගැති ගිණුම හර 20000 විකුණුම් ගිණුම බැර 20000
10. බඩු තොග ණයට ගැණුම් රු. 45000	ගැණුම් ගිණුම හර 45000 ණයහිමි ගිණුම බැර 45000

ඉහත ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම

මුදල් ගිණුම

1. ප්‍රාග්ධන ගිණුම	50000	2. ගැණුම් ගිණුම	12000
3. බැංකු ණය ගිණුම	60000	5 වැටුප් ගිණුම	3000
4. විකුණුම් ගිණුම	50000	7. ගැනිලි ගිණුම	1000
		8 බැංකු ණය ගිණුම	10000
		ශේෂය ප/ගෙ	134000
	160000		160000
ශේෂය ඉ/ගෙ	134000		

ප්‍රාග්ධන ගිණුම

ශේ/ ප/ගෙ	150000	1	මුදල් ගිණුම	50000
		6	මෝටර් රථ ගිණුම	100000
	150000			150000
		ශේෂය ඉ/ගෙ		150000

ගැණුම් ගිණුම

2. මුදල්	12000		
10 ණයහිමි ගිණුම	45000		

බැංකු ණය ගිණුම

8 මුදල් ගිණුම	10000	3 මුදල් ගිණුම	60000

විකුණුම් ගිණුම

		4. මුදල් ගිණුම	50000
		9 ණයගැති ගිණුම	20000

වැටුප් ගිණුම

5. මුදල් ගිණුම	3000		

මෝටර් රථ ගිණුම

6 ප්‍රාග්ධන ගිණුම	100000		

ගැනිලි ගිණුම

7 මුදල් ගිණුම	1000		

ණයගැති ගිණුම

9 විකුණුම් ගිණුම	20000		

ණයහිමි ගිණුම

		10 ගැණුම් ගිණුම	45000

ගිණුම් කාලච්ඡේදයේ ගනුදෙනු ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම්වල පිටපත් කළ පසු සියලු ගිණුම් තුලනය කර ඊළඟ කාලච්ඡේදය සඳහා ශේෂය ඉදිරියට ගෙනඒම සිදු කරන්න.

මේ ආකාරයේ අභ්‍යාස කිහිපයක් සිසුන්ට ලබා දෙන්න. ඒවායේ නිවැරදි බව පරීක්ෂා කරන්න.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- වත්කම්, වගකීම්, ආදායම් ,වියදම් , හිමිකම් ,ගැනිලි, අමතර ප්‍රාග්ධනය යෙදීම, ණයවාරික ගෙවීම ආදී ගනුදෙනු පහක් වටිනාකම් සහිතව වෙන් වෙන් ව කාඩ්පත්වල හෝ ලියන කඩදාසි තීරුවල ලියා ගන්න.
- ඉහත ලියන ලද ගනුදෙනු පහට අදාළ ද්විත්ව සටහන් පහ වෙන වෙනම කඩදාසි තීරුවල හෝ කාඩ්පත්වල ලියා ගන්න.
- ලියන ලද සියලු කාඩ්පත් හා ලියන කඩදාසි තීරු සියල්ල පෙට්ටයක බහා මිශ්‍ර කරන්න
- . එක් එක් සිසුවාට එක් වරකට එක කාඩ්පතක් හෝ ලියන කඩදාසි තීරුවක් ගැනීමට ඉඩ සලස්වන්න.

සිසුන්ට පහත උපදෙස් ලබා දෙන්න

1. තමාට ලද තීරුවේ ඇතුළත් ගනුදෙනුව හෝ ද්විත්ව සටහනට අදාළ ව,ගිණුම් නම් කර එම ගිණුම් පහත සදහන් ගිණුම් වර්ගයට ඇතුලත් කරන්න

වත්කම් ගිණුම
වගකීම් ගිණුම
හිමිකම් ගිණුම
ආදායම් ගිණුම
වියදම් ගිණුම

2. ගනුදෙනුවක් ලැබී ඇත්නම් එහි ද්විත්ව සටහන අනෙක් සිසුන්ගෙන් විමසා අදාළ කඩදාසි තීරුව/ කාඩ්පත සොයා ගැනීම.
3. ද්විත්ව සටහන ලැබී ඇත්නම් එයට අදාළ ගනුදෙනුව අත ඇති ශිෂ්‍යයා සොයා ගැනීම.
4. තම සටහන් පොතෙහි ,
   ගනුදෙනුව - ද්විත්ව සටහන - අදාළ ගිණුම් වර්ගය, සියලු ගනුදෙනුවලට අදාළව ලියා ගැනීමට ඉඩ සැලැස්වීම.
5. මේ එකිනෙක කාඩ්පත් මාරු කරමින් එක් සිසුවකු ගනුදෙනු 5 ටම පිළිතුරු සපයන ආකාරයට ක්‍රීඩාවේ යෙදවීම.
6. එම ලියාගත් ගනුදෙනු පහ හා ද්විත්ව සටහන ලෙජරයට පිටපත් කිරීමට සැලැස්වීම.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  4 වන පාඩම - ව්‍යාපාර ගණුදෙනු වාර්තා කිරීම

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු පහත සඳහන් ආකාරයට ලෙජරයට පිටපත් කර ඇත.

මුදල් ගිණුම

1. ප්‍රාග්ධන ගිණුම	100000	3. ගැණුම් ගිණුම	20000
2. බැංකු ණය ගිණුම	50000	5. උපකරණ ගිණුම	30000
4. විකුණුම් ගිණුම	40000	6. බැංකු ණය ගිණුම	10000
8. ලද කොමිස් ගිණුම	5000	7. ප්‍රචාරණ වියදම් ගිණුම	2000
10 ණයගැති ගිණුම	4000		

ණයගැති ගිණුම

9 විකුණුම්	50000	10 මුදල් ගිණුම	4000

ගැණුම් ගිණුම

3 මුදල්	20000		
11 ණයහිමි ගිණුම	15000		

ණයහිමි ගිණුම

		11 ගැණුම්	15000

විකුණුම් ගිණුම

		4 මුදල්	40000
		9 ණයගැති ගිණුම	50000

(1) ඉහත ව්‍යාපාරයේ සිදුවී ඇති ගනුදෙනු අනුපිළිවෙළින් පෙළගැස්වීම.

(2) ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු 5ක් වටිනාකම් සහිතව ලියා, ඒවා ද්විත්ව සටහන් ක්‍රමය අනුව ලෙජරයට පිටපත් කර ගිණුම් තුලනය කිරීම.

(3) උපකල්පිත ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු වටිනාකම් ඇතුළත්ව නිර්මාණය කළ සිද්ධියක් අධ්‍යයනය කර

1. ද්විත්ව බලපෑම
2. ද්විත්ව සටහන හා
3. ලෙජර් ගිණුම් පිළියෙල කිරීම

(4) පහත වගුවේ දැක්වෙන ගනුදෙනුවල ද්විත්ව සටහන ලියා දැක්වීම.

ගනුදෙනු	ද්විත්ව සටහන
1. ණයට විකුණුම්	....
2. ණයට ගැණුම්	....
3. බැංකු ණය ගැනීම	....
4. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම	....
5. බැංකු ණය ආපසු ගෙවීම	....
6. මුදල් ගැනිලි	....
7. ගෙවල්කුලී ගෙවීම	....
8. ලද කොමිස්	....
9. අතිරික්ත ප්‍රාග්ධනය සෙවීම	....
10. උපකරණ මිලට ගැනීම	....

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 5.1 : මුදලින් සිදුවන ගනුදෙනු වාර්තා කිරීම සඳහා මුදල් පොත පවත්වා ගනියි.

කාලච්ඡේද : 05

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- මූලික පොත් පැහැදිලි කර නම් කිරීමට.
- මූලික පොත්වල අවශ්‍යතාව දැක්වීමට.
- මූලාශ්‍ර ලේඛනවල වැදගත්කම පැහැදිලි කිරීමට.
- එක් එක් මූලික පොතට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීමට.
- මුදල් පොත විස්තර කර එහි අවශ්‍යතාව දක්වයි.
- මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීමට.
- මුදල් පොතේ ද්විත්ව කාර්ය පැහැදිලි කිරීමට.
- මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

මූලික පොත් හා ඒවායේ අවශ්‍යතාව

ගනුදෙනුවක් සිදුවූ අවස්ථාවේදී ම එහි සියලු විස්තර ඇතුළත් කරන ලියවිල්ල මූලාශ්‍ර ලේඛනය නමින් හැඳින්වේ. එම මූලාශ්‍ර ලේඛනය උපයෝගී කරගෙන ගනුදෙනුවක් මුලින් ම සටහන් කරන පොත මූලික පොත වේ.සෑම ගනුදෙනුවකින්ම මූලාශ්‍ර ලේඛනයක් බිහිවන අතර, ඒවා සටහන් කිරීමට මූලික පොතක්ද තිබේ. එය පහත අකාරයෙන් දැක්විය හැකි ය.

ගනුදෙනුවේ ස්වභාවය	මූලාශ්‍ර ලේඛනය	මූලික පොත
1. මුදල් ලැබීම්	ලදුපත	මුදල් පොත
මුදල් ගෙවීම්	වවුචරය	මුදල් පොත
2. චෙක්පත්වලින් ගෙවීම්	පිලිපත	බැංකු ගිණුම
3. සුළු වටිනාකම්වලින් ගෙවීම්	සුළු මුදල් වවුචරය	සුළු මුදල් පොත
4. වෙළෙඳ භාණ්ඩ ණයට ගැණුම්	ගැණුම් ඉන්වොයිසිය	ගැණුම් ජර්නලය
5. වෙළෙඳ භාණ්ඩ ණයට විකුණුම්	විකුණුම් ඉන්වොයිසිය	විකුණුම් ජර්නලය
6. වෙනත් ගනුදෙනු	ජර්නල් වවුචරය	පොදු ජර්නලය

මූලාශ්‍ර ලේඛනයක තිබිය යුතු මූලික තොරතුරු

- ගනුදෙනුව සිදුවූ දිනය
- ගනුදෙනුවට සම්බන්ධ පාර්ශ්වයන්ගේ නම් හා ලිපිනයන්
- ගනුදෙනුවේ විස්තර
- මුළු වටිනාකම
- නිලමුද්‍රාව හා අත්සන් ආදී තොරතුරු

මුදල් පොත හා එහි අවශ්‍යතා

ව්‍යාපාරයක නිශ්චිත කාලච්ඡේදයක් තුළ සිදුවූ සියලු මුදල් ලැබීම් හා මුදල් ගෙවීම්වලට අදාළ ගනුදෙනු සටහන් කරන මූලික පොත මුදල් පොත ලෙස හැඳින්වේ.

මුදල් පොත ද්විත්ව කාර්යයක් ඉටු කරයි. එනම්,

1. ලෙජරයේ ගිණුමක් ලෙස ක්‍රියා කිරීම.
2. මූලික පොතක් ලෙස ක්‍රියා කිරීම

මුදල් ලැබීම් ගනුදෙනු සටහන් කිරීම

- ප්‍රාග්ධනය යෙදීම
- අත්පිට විකුණුම්
- බැංකු ණය ලබා ගැනීම
- ණයගැතියන්ගෙන් මුදල් ලැබීම්
- ගෙවල්කුලී ලැබීම්
- පොලී ලැබීම
- ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් යනාදිය

මුදල් ගෙවීම් ගනුදෙනු සටහන් කිරීම

- අත්පිට ගැණුම්
- ණයහිමියන්ට ගෙවීම්
- බැංකු ණය වාරික ගෙවීම්
- ගෙවල්කුලී/ විදුලි බිල්/ වැටුප් යනාදී වියදම් ගෙවීම්
- ස්ථාවර වත්කම් මිලට ගැණුම්
- මුදල් ගැනිලි යනාදිය

මුදල් ලැබීම් සටහන් කිරීමට ලදුපත ද, මුදල් ගෙවීම් සටහන් කිරීමට වවුචරය ද මූලාශ්‍ර ලේඛන ලෙස යොදා ගනියි. මුදල් පොතේ ගනුදෙනු සටහන් කරන්නේ වත්කම් වැඩිවීම හර වත්කම් අඩුවීම බැර යන පදනම අනුවයි

මුදල් වත්කම් වැඩිවීම මුදල් පොත	හර
මුදල් වත්කම අඩුවීම මුදල් පොත	බැර

මුදල් පොතේ ආකෘතිය

මුදල් පොත

හර | බැර

දිනය	ල අ	විස්තරය	ස පි	මුදල් රු.	දිනය	ව අ	විස්තරය	ස ප	මුදල රු.

මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරීම

ද්විත්ව සටහන් රීතියට අනුව, මුදල් පොතේ ගනුදෙනු සටහන් කරයි.

නිදසුන :

සුමන ව්‍යාපාරයේ ජනවාරි මුල් සති දෙක තුළ සිදුවූ ගනුදෙනු

ල.අ.09 2013.01.01 ප්‍රාග්ධනය රු. 50000
ල.අ.10 2013.01.02 රු. 50000 ක බැංකු ණය ගැනීම
ව.අ.01 2013.01.03 රු. 30000 ක බඩුතොග මුදලට ගැනීම
ල.අ.11 2013.01.04 රු. 60000 ක් අත්පිට විකුණුම්වලින් ලැබීම
ව.අ.02 2013.01.06 රු. 10000 ක් වටිනා ලී බඩු මුදලට ගැනීම
ව.අ.03 2013.01.07 රු. 2500 ක වැටුප් ගෙවීම
ල.අ.12 2013.01.08 රු. 12000 ක විවිධ ආදායමක් ලැබීම
ව.අ.04 2013.01.09 රු. 1000 ක මුදල් ගැනිලි සිදු කිරීම
ල.අ.13 2013.01.10 රු. 50000 ක් අත්පිට විකුණුම්වලින් ලැබීම
ව.අ.05 2013.01.15 අත්පිට ගැණුම් සඳහා රු. 25000 ක් ගෙවීම

අවශ්‍ය වන්නේ :

1. ගනුදෙනුවල ද්විත්ව සටහන ලිවීම
2. ගනුදෙනු මුදල් පොතේ සටහන් කිරීම
3. ලෙජරයට පිටපත් කිරීම
4. මුදල් ගිණුම හා අනෙක් ගිණුම් තුලනය කිරීම

(1)

(1)	මුදල් ගිණුම	හර	50000
	ප්‍රාග්ධන ගිණුම	බැර	50000
(2)	මුදල් ගිණුම	හර	50000
	බැංකු ණය ගිණුම	බැර	50000
(3)	ගැණුම් ගිණුම	හර	30000
	මුදල් ගිණුම	බැර	30000
(4)	මුදල් ගිණුම	හර	60000
	විකුණුම් ගිණුම	බැර	60000
(5)	ලී බඩු ගිණුම	හර	10000
	මුදල් ගිණුම	බැර	10000
(6)	වැටුප් ගිණුම	හර	2500
	මුදල් ගිණුම	බැර	2500
(7)	මුදල් ගිණුම	හර	12000
	විවිධ ආදායම් ගිණුම	බැර	12000
(8)	ගැනිලි ගිණුම	හර	1000
	මුදල් ගිණුම	බැර	1000

(9) මුදල් ගිණුම හර 50000
විකුණුම් ගිණුම බැර 50000

(10) ගැණුම් ගිණුම හර 25000
මුදල් ගිණුම බැර 25000

(2)

මුදල් පොත

දිනය	ල අ	විස්තරය	ස පි	මුදල්	දිනය රු.	ව අ	විස්තරය	ස පි	මුදල රු.
01/01	01	ප්‍රාග්ධන ගිණුම		50000	01/03	01	ගැණුම් ගිණුම		30000
01/02	10	බැංකු ණය ගිණුම		50000	01/06	02	ලීබඩු ගිණුම		10000
01/04	22	විකුණුම් ගිණුම		60000	01/07	03	වැටුප් ගිණුම		2500
01/08	07	විවිධ ආදායම් ගිණුම		12000	01/09	04	ගැනිලි ගිණුම		1000
01/09	25	විකුණුම් ගිණුම		50000	01/15	05	ගැණුම් ගිණුම		25000
					01/15		ශේ/ප/ගෙ		153500
				222000					222000
1/16		ශේ/ඉ/ගෙ		153500					

ප්‍රාග්ධන ගිණුම

1/15 ශේ/ප/ගෙ	50000	1/1 මුදල් ගිණුම	50000
	50000		50000
		1/16 ශේ/ඉ/ගෙ	50000

බැංකු ණය ගිණුම

1/15 ශේ/ප/ගෙ	50000	1/2 මුදල් ගිණුම	50000
	50000		50000
		1/16 ශේ/ඉ/ගෙ	50000

ගැණුම් ගිණුම

1/3 මුදල් ගිණුම	30000	1/15 ශේ/ප/ගෙ	55000
1/15 මුදල් ගිණුම	25000		
	55000		55000
1/16 ශේ/ඉ/ගෙ	55000		

ලීබඩු ගිණුම

1/6 මුදල් ගිණුම	10000	1/15 ශේ/ප/ගෙ	10000
	10000		10000
1/16 ශේ/ඉ/ගෙ	10000		

වැටුප් ගිණුම

1/7 මුදල් ගිණුම	2500	1/15 ශේ/ප/ගෙ	2500
	2500		2500
1/16 ශේ/ඉ/ගෙ	2500		

විවිධ ආදායම් ගිණුම

1/15 ශේ/ප/ගෙ	12000	1/8 මුදල් ගිණුම	12000
	12000		12000
		1/16 ශේ/ඉ/ගෙ	12000

ගැනිලි ගිණුම

1/9 මුදල් ගිණුම	1000	1/15 ශේ/ප/ගෙ	1000
	1000		1000
1/16 ශේ/ප/ගෙ	1000		

අභ්‍යාස

1. හර්මන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2012 දෙසැම්බර් මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

		රු.
2012.12.01	දින මුදල් ශේෂය	150000
2012.12.05	බඩුතොග මිලට ගැණුම්	50000
2012.12.05	අත්පිට විකුණුම්	75000
2012.12.07	ණයට විකුණුම්	100000
2012..12.10	ණයට බඩු තොග ගැණුම්	30000
2012.12.12	ණයට විකුණුම්	45000
2012.12.15	අත්පිට විකුණුම්	50000
2012.12.20	අත්පිට ගැණුම්	40000
2012.12.25	බැංකු ණය ගත්තා	25000
2012.12.26	ණය ගැතියන්ගෙන් ලැබුණා	25000
2012.12.30	ණය හිමියන්ට ගෙව්වා	30000

අවශ්‍ය වන්නේ

1. ගනුදෙනුවල ද්විත්ව සටහන ලිවීම
2. ලෙජර් ගිණුම්වල සටහන් කිරීම
3. ගිණුම් තුලනය කිරිම
4. මුදල් පොතේ සටහන් නොවන ගනුදෙනු නම් කිරීම.

2. විකුණුම් ගිණුම
   1. වියදම් ගිණුමකි
   2. වත්කම් ගිණුමකි
   3. ආදායම් ගිණුමකි
   4. වගකීම් ගිණුමකි

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- ව්‍යාපාර දෙකක 2013 ජනවාරි මුල් සති දෙකේ සිදුවූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

කුමාරි ව්‍යාපාරය

	රු.
1. ප්‍රාග්ධනය යෙදීම	50000
2. බඩුතොග ගැණුම්	10000
3. අත්පිට විකුණුම්	40000
4. විදුලිබිල ගෙව්වා	5000
5. මුදල් ගැනිලි	1000

කුසුම් ව්‍යාපාරය

	රු.
1. බැංකු ණය ගත්තා	45000
2. බඩු තොග ණයට ගැණුම්	15000
3. අත්පිට විකුණුම්	25000
4. සේවක වැටුප් ගෙව්වා	4000
5. අතිරේක ප්‍රාග්ධනය යෙදීම	10000

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමක් (1) කුමාරි ව්‍යාපාරය ලෙස ද, අනෙක් කණ්ඩායම (2) කුසුම් ව්‍යාපාරය ලෙස ද නම් කරන්න.

- ව්‍යාපාර දෙකේ ගනුදෙනු අදාළ කණ්ඩායමට ලබා දෙන්න.

- තම ව්‍යාපාරයේ මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ගනුදෙනු වෙන් වෙන්ව දැක්වීමට සලස්වන්න.
- එම ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලිවීමට ඉඩ දෙන්න.
- මෙම ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලික පොත පිළියෙල කරවන්න., ලෙජරයට පිටපත් කරවන්න.
- විෂය කරුණු හා ඉගෙනුම් ඵල සංවර්ධනය කෙරෙන ආකාරයට මෙවැනි ක්‍රියාකාරකම් කීපයක් සිසුන්ට ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය,
  5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

1. ව්‍යාපාරයකට අදාළ මුදල් ලැබීම් ගනුදෙනු 3 ක්ද, මුදල් ගෙවීම් ගනුදෙනු 3 ක්ද ලිවීම. (වටිනාකම් සහිතව)
2. එම ගනුදෙනු මුදල් පොතක සටහන් කර මුදල් පොත තුලනය කිරීම.
3. මුදල් පොතේ සටහන් නොකරන ගනුදෙනු සඳහා නිදසුන් හතරක් සැපයීම.
4. ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු මුදල් පොතේ සටහන් කර ලෙජරයට පිටපත් කිරීම.
5. කණ්ඩායම් සහයෝගයෙන් වැඩ කිරීම.

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.2 : බැංකු ගනුදෙනු බැංකු ගිණුමේ බැංකු පොතේ වාර්තා කරයි.
කාලච්ඡේද : 04

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලගාකර ගත හැකි වේ.

- බැංකු ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීමට.
- මුදල් තැන්පතු, චෙක්පත් තැන්පතු හා චෙක්පත් නිකුත් කිරීම් බැංකු ගිණුමේ සටහන් කිරීමට.
- චෙක්පතක් අගරුවීමට හේතු දක්වමින් අගරු චෙක්පත් වාර්තා කිරීමට.
- බැංකු ශේෂය ගණනය කිරීමට.
- බැංකු අයිරාව පැහැදිලි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- මූලාශ්‍ර ලේඛන
  - පිලිපත හා චෙක්පත් තැන්පතු පත්‍රය
- බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීම
  - මුදල් තැන්පත් කිරීම
  - චෙක්පත් තැන්පත් කිරීම
  - බැංකු ගිණුමෙන් මුදල් ආපසු ගැනීම
  - චෙක්පත් නිකුත් කිරීම
  - චෙක්පත් අගරු වීම් ඇතිවන ආකාරය.
- බැංකු අයිරාව ඇතිවන ආකාරය පැහැදිලි කිරීම

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- ව්‍යාපාරයක සිදුව ඇති පහත සඳහන් ගනුදෙනු සිසුන්ට ඉදිරිපත් කර එහි ද්විත්ව සටහන විමසන්න.
  - 2013.01.01 ණයගැතියකු වූ සාරාංගයෙන් රු. 100000 ක් ලැබීම.
  - 2013.01.03 ව්‍යාපාරය රු. 80000 ක් බැංකුවේ තැන්පත් කිරීම

- ඉහත ගනුදෙනුවලින් බැංකු ගිණුමේ සටහන් කරන ගනුදෙනුව පිළිබඳ ද්විත්ව සටහන මතුකර දක්වන්න.
    - බැංකුවේ මුදල් තැන්පත් කිරීම
    - ව්‍යාපාරයට චෙක්පතක් ලැබීම
    - ලද චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීම
    - ගනුදෙනු 3 ක් සඳහා චෙක්පත් 3 ක් නිකුත් කිරීම
    - තැන්පත් කළ චෙක්පත අගරුවීම
    - නිකුත් කළ චෙක්පතක් අගරුවීම

- සිසුන් ලියන ලද ඉහත ගනුදෙනුවලින් හයක් බැංකු ගිණුමේ හා ලෙජරයේ සටහන් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- බැංකු ගිණුම තුලනය කර එහි ශේෂය ලබා ගැනීමට යොමු කරන්න.
- **බැංකු අයිරාවක්** ඇති වන ආකාරය පැහැදිලි කරන්න.
- පහත අභ්‍යාසය සිසුන්ට ලබා දී විසඳීමට ඉඩ ලබා දෙන්න.

1. සූරිය ව්‍යාපාරයේ 2013.03 මාසයේ සිදුවූ ගනුදෙනු මෙසේ ය.

රු.

3/1 බැංකු ශේෂය 110000

3/2 අත්පිට විකුණුම් 50000

3/3 බැංකුවේ තැන්පත් කිරීම රු. 30000

3/5 විදුලිබිල ගෙවීම චෙක්පතකින් 5000

3/6 ණයහිමියකුවූ කැළුම්ට චෙක්පතකින් ගෙවීම 4000

3/7 රු. 15000 ක චෙක්පතක් ලැබීම සමීරගෙන්

3/10 රක්ෂණ වාරිකය චෙක්පතකින් රු. 4000 ක් ගෙවීම

3/12 බැංකුවෙන් 10000 ක් ආපසු ගැනීම

3/15 මුදලින් වැටුප් ගෙවීම රු. 8000

3/16 3/7 දිනැති ලද චෙක්පත බැංකුගත කිරීම

3/16 ණයගැතියෙක් වු කමනිගෙන් ලද රු. 10000 ක චෙක්පතක් එදිනම බැංකුගත කිරීම

3/17 කැළුම්ට නිකුත් කළ රු. 4000 ක චෙක්පත අගරු වූ බව දැනුම් දී ඇත.

3/20 අත්පිට විකුණුම්වලින් ලද රු. 50000 බැංකුවේ තැන්පත් කිරීම

3/25 3/16 දින තැන්පත් කළ චෙක්පත අගරු වී ඇත.

1 ඉහත ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලිවීමට උපදෙස් දෙන්න.

2 3/25 ගනුදෙනු ගිණුම්වල වාර්තා කරන ආකාරය සිසුන්ගෙන් විමසන්න.

පිළිතුර :

බැංකු ගිණුම හර 10000
කමනි (ණයගැති) බැර 10000

කමනි (ණයගැති) හර 10000
බැංකු ගිණුම බැර 10000

- බැංකු ගිණුම හා මුදල් පොත සම්බන්ධ වන ගනුදෙනු මතු කරවන්න.
- බැංකු ගිණුම හා ලෙජරය පිළියෙල කිරීමට සිසුන් යොමු කරන්න.

- **මෙවැනි අභ්‍යාස කිහිපයක් සිසුන්ට ලබා දී විසඳීමට යොමු කරන්න.**
- **බැංකු අයිරාවක් ලැබෙන සේ අභ්‍යාස ද ලබා දෙන්න.**

බැංකු ගිණුම / පොත

දිනය	ල.අ	විස්තරය	ස.අ.	වටිනාකම රු.	දිනය	ව.අ.	විස්තරය	ස.පි.	වටිනාකම රු.
ජ.1		x		x	ජ.2		x		x
10		x		x	ජ.6		x		x
25		x		x	14		x		x
29		x		x	17		x		x
29		x		x	18		x		x
					20		x		x
					22		x		x
					23		x		x
					31		ප/ගෙ/ශෙ		x
					xx				xx

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම නිර්ණායක :

- බැංකු ගිණුමට අදාළ මූලාශ්‍ර ලේඛන දැක්වීම.
- බැංකු ගිණුම හා මුදල් පොතේ ද්විත්ව සටහන් යෙදෙන ගනුදෙනු තුනක් ලිවීම.
- බැංකු අයිරාව පැහැදිලි කිරීම.
- දෙන ලද ගනුදෙනු හතරක් ඇසුරින් බැංකු ගිණුම පිළියෙල කර තුලනය කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.3: බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරයි.
කාලච්ඡේද : 05

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- බැංකු ප්‍රකාශනය පැහැදිලි කිරීමට.
- බැංකු ප්‍රකාශයේ ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය වෙනස්වීමට බලපාන හේතු දැක්වීමට.
- බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමට.
- වාසිදායක ශේෂය පදනම් ව බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- බැංකු ප්‍රකාශනය පැහැදිලි කිරීම.
- බැංකු ප්‍රකාශනයේ ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය වෙනස්වීමට බලපාන හේතු
- බැංකු ප්‍රකාශනයේ ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය සමාන වුවත් බැංකු සැසඳුම පිළියෙල කළ යුතුවීම.
- ශේෂය වෙනස්වීමට බලපාන හේතු
- වෙනස්වීමට බලපෑ හේතු වලින් අදාළ හේතු පදනම් කරගෙන බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.
- බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය පදනම් කරගෙන බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම.

බැංකු ගිණුමේ වාසිදායක ශේෂය පමණක් සැලකිල්ලට ගෙන බැංකු සැසඳුම පිළියෙල කිරීම මෙම මට්ටමේ දී අපේක්ෂා කෙරේ.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- බැංකු ප්‍රකාශනය පැහැදිලි කරන්න.
- දෙන ලද ගනුදෙනු ඇසුරින් බැංකු ප්‍රකාශනයක් පිළියෙල කිරීමට යොමු කරවන්න.
- ඒ අනුව බැංකු ප්‍රකාශයේ ඇතුළත් වන අයිතම/ ගනුදෙනු මතුකර දෙන්න.
- බැංකු ප්‍රකාශයේ ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කර දෙන්න.
- බැංකු ප්‍රකාශයේ ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය වෙනස් වන්නේ ඇයි යන ප්‍රශ්නය සිසුන්ට ඉදිරිපත් කරන්න.

- පහත සඳහන් අභ්‍යාස සිසුන්ට ලබා දෙන්න.

බැංකු ගිණුම

2013/5/1	ශේෂය	40000	2013/5/1	ඩේවිඩ්	CH 100	8000
5/2	මුදල් තැන්පතු	10000	5/9	කීල්ස්	CH 101	5000
5/10	සමන්	6000	5/27	විදුලිය	CH 102	1000
5/22	කුමාර	4000	5/30	ගෙවල්කුලි	CH 103	7000
			5/31	ශේෂය/ප/ගෙ		39000
		60000				60000
6/1	ශේෂය ඉ/ගෙ	39000				

බැංකු ප්‍රකාශනය

දිනය	විස්තරය	හර රු.	බැර රු.	ශේෂය රු.
2013.5.1	ශේෂය	-	-	40000
2013.5.1	ඩේවිඩ් CH 100	8000	-	32000
2013.5.2	තැන්පතු මුදල්	-	10000	42000
2013.5.3	තැන්පතු - සමාරා	-	5000	47000
2013.5.9	කීල්ස් CH 011	5000	-	42000
2013.5.10	සමන්		6000	48000
2013.5.28	බැංකු ගාස්තු	200	-	47800
2013.5.28	ස්ථාවර නියෝග - රක්ෂණ වාර	2000	-	45800
2013.5.30	චෙක්පොත් ගාස්තු	100	-	45700

- බැංකු ප්‍රකාශයේ හා බැංකු ගිණුමේ 2013.5.30 දිනට ශේෂ පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- ඒ අනුව ශේෂ වෙනස්වීමට බලපා ඇති හේතු ලැයිස්තුගත කිරීමට උපදෙස් දෙන්න.
- බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමට අදාළ අයිතම හඳුනාගෙන බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමට ඉඩ ලබා දෙන්න.
- එම බැංකු- ගිණුමේ සංශෝධිත ශේෂය ඇසුරින් 2013.5.30 දින බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට යොමු කරන්න.

- බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම.
  බැංකු ගිණුමේ සංශෝධිත ශේෂයට. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් එකතු කිරීමට හා තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් අඩු කිරීමට අදාළ හේතුව තර්කානුකූලව සිසුන් තුළ ගොඩනගන්න.

- මෙවැනි අභ්‍යාස හා වෙනසට හේතු ඉදිරිපත් කර බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ අභ්‍යාස කීපයක් සිසුන්ට පිළියෙල කිරීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  6 වන පාඩම - බැංකු සැසඳුම් විස්තරය

තක්සේරුව හා ඇගයීම නිර්ණායක :

- බැංකු ප්‍රකාශනයක ඇතුළත් වන අයිතම හතරක් නම් කිරීම.
- දෙන ලද තොරතුරු ඇසුරින් බැංකු ප්‍රකාශනයක් පිළියෙල කිරීම.
- බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස්වීමට බලපාන හේතු දැක්වීම.
- බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.
- වාසිදායක බැංකු ශේෂය පදනම් කරගෙන බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.4: මුදල් වට්ටම් සම්බන්ධ ගනුදෙනු මුදල් පොතේ සටහන් කරයි.
කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලගාකර ගත හැකි වේ.

- මුදල් වට්ටම් පැහැදිලි කිරීමට.
- වට්ටම් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීමට.
- වට්ටම් සහිත ගනුදෙනු මුදල් පොතේ සටහන් කිරීමට.
- මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- මුදල් වට්ටම්
- දුන් වට්ටම්, ලද වට්ටම් පැහැදිලි කිරීම
- වට්ටම් සහිත මුදල් පොතට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීම.
- වට්ටම් සහිත මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම.
  - දුන් වට්ටම් ගිණුම
  - ලද වට්ටම් ගිණුම
  - අනෙකුත් ලෙජර් ගිණුම

වට්ටම් තීරුවලට අදාළ ද්විත්ව සටහන්

- දුන් වට්ටම් - දුන් වට්ටම් ගිණුම හර
  ණයගැති ගිණුම බැර

(මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව)

- ලද වට්ටම් - ණයහිමි ගිණුම හර
  ලද වට්ටම් ගිණුම බැර

(මුදල් පොතේ බැර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව)

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පහත සඳහන් අභ්‍යාසය සිසුන් සමඟ විසඳන්න.
- සුමඟ ව්‍යාපාරය 2013 අප්‍රේල් මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

		රු.			
2013.4.1	මුදල් ශේෂය	50000			
4/3	අත්පිට විකුණුම්	30000			
4/4	ණයට විකුණුම්	-	කමල්ට	15000	
			කුමාරට	20000	
4/5	අත්පිට ගැණුම්	40000			
	ණයට ගැණුම්	-	ආශා	30000	
			නිශා	5000	
4/10	වැටුප් ගෙවීම	1000			
	විදුලිබිල ගෙවීම	2000			
	රක්ෂණ වාරිකය ගෙවීම	1500			
	සංග්‍රහ වියදම්	500			
4/15	ආශාට ගෙව්වා	9400	වට්ටම	600	
4/16	නිශාට ගෙව්වා	4800	වට්ටම	200	
4/17	ණයගැතියන්ගෙන් ලැබුණා.				
		කමල්ට	9800	වට්ටම	200
		කුමාර	19500	වට්ටම	500

4/25 උපකරණ ගත්තා රු. 10000

ඉහත ගනුදෙනු වට්ටම් තීරු සහිත මුදල් පොතේ පහත ආකාරයට සටහන් කිරීමට සිසුන්ට යොමු කරන්න.

මුදල් පොත

දිනය	විස්තරය	වට්ටම් රු.	මුදල් රු.	දිනය	විස්තරය	වට්ටම් රු.	මුදල් රු.
4/1	ශේෂය		50000	4/5	ගැණුම්		40000
4/3	විකුණුම්		30000	4/10	වැටුප්		1000
4/17	කමල්	200	9800		විදුලිය		2000
	කුමාර	500	19500		රක්ෂණ		1500
					සංග්‍රහ		500
				4/15	ආශා	600	9400
				4/16	නිශා	200	4800
				4/25	උපකරණ		10000
				4/30	ශේ/ප/ගෙ		-
		700	109300			800	109300

දුන් වට්ටම් ගිණුම

4/30 ණයගැතියෝ 700	

ලද වට්ටම් ගිණුම

	4/30 ණයහිමියෝ 800

කමල් ගිණුම

4/4 විකුණුම්	15000	4/17 මුදල	9800
		දුන් වට්ටම්	200
		4/30 ශේ/ප/ගෙ	5000
	15000		15000
5/1 ශේ/ඉ/ගෙ	5000		

ආශා ගිණුම

4/15 මුදල	9400	4/5 ගැණුම්	30000
ලද වට්ටම්	600		
4/30 ප/ගෙ	20000		
	30000		30000
		5/1 ඉ/ගෙ	20000

කුමාර ගිණුම

4/4 විකුණුම්	20000	4/17 මුදල්	19500
		දුන් වට්ටම්	500
	20000		20000

නිශා ගිණුම

4/16 මුදල්	4800	4/5 ගැණුම්	5000
ලද වට්ටම්	200		
	5000		5000

- අනෙකුත් ලෙජර් ගිණුම් ද පිළියෙල කිරීමට යොමු කරන්න.
- වට්ටම් සහිත ගනුදෙනු ඇතුළත් මෙවැනි අභ්‍යාස කිහිපයක් සිසුන්ට විසඳීමට ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම නිර්ණායක :

- මුදල් වට්ටම් පැහැදිලි කිරීම.
- වට්ටම් සහිත ගනුදෙනු ඇසුරින් මුදල් පොත පිළියෙල කර ලෙජරයට පිටපත් කිරීම.
- වට්ටම් තීරුවල ගනුදෙනුවලට අදාළ,
  - ද්විත්ව සටහන
  - ලෙජරය දැක්වීම

- දුන් වට්ටම් හා ලද වට්ටම් බිහිවන ආකාරය නිදසුනක් මගින් ඉදිරිපත් කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.5: සුළු ගෙවීම් සටහන් කිරීමට සුළු මුදල් පොත පවත්වා ගනියි.
කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- සුළු මුදල් ගනුදෙනු දැක්වීමට.
- සුළු මුදල් පොතට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීමට.
- සුළු මුදල් අග්‍රිමය පැහැදිලි කිරීමට.
- සුළු මුදල් පොත පිළියෙල කිරීමට.
- සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට.
- සුළු මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- සුළු මුදල් පොතක අවශ්‍යතාව දක්වා සුළු මුදල් ගනුදෙනු පැහැදිලි කිරීම.
- සුළු මුදල් පොතට අදාළ මූලාශ්‍ර ලේඛන

• ලදුපත
• සුළු මුදල් වවුචර්

- සුළු මුදල් අග්‍රිමය පැහැදිලි කිරීම
- සුළු මුදල් පොත පිළියෙල කිරීම හා ලෙජරයට පිටපත් කිරීම.
- සුළු මුදල් පොත තුලනය කර ප්‍රතිපූර්ණය කිරීම

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පහත සඳහන් අභ්‍යාසය ඇසුරින් සුළු මුදල් පොත පිළියෙල කිරීම, තුලනය කිරීම හා ලෙජරයට පිටපත් කිරීමට සිසුන්ට මගපෙන්වන්න.

මෙහොමඩ්ගේ ව්‍යාපාරයේ 2013 මැයි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

5/1 ල.අ. 003 සුළු මුදල් භාරකරුට රු. 2000 ක් ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලැබීම.
5/2 ව.අ. 102 ලිපිද්‍රව්‍ය ගත්තා 150
5/5 ව.අ. 103 සංග්‍රහ වියදම් 200

5/7 ව.අ. 104 පිරිසිදු කිරීමට 60
5/10 ව.අ. 105 තැපැල් ගාස්තු 200
5/12 ව.අ. 106 මුද්දර 50
5/15 ව.අ. 107 පෑන් පැන්සල් 110
5/20 ව.අ. 108 සීනි/ තේකුඩු 100
5/22 ව.අ. 109 ඡායා පිටපත් කිරීම 75
5/25 ව.අ. 110 ලිපි ලියාපදිංචි කිරීම 105
5/26 ව.අ. 111 යතුරුලියන රිබන් 150
5/28 ව.අ. 112 කාබන් කොළ 75
5/29 ව.අ. 113 සංග්‍රහ වියදම් 250
5/29 ව.අ. 114 ලී බඩු ගත්තා 750

5/30 අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා

සුළු මුදල් පොතක ආකෘතිය

ලැබීම් රු.	ස පි	දිනය	විස්තරය	ව අ	ගෙවීම් රු.	විශ්ලේෂණය			
						ලිපි ද්‍රව්‍ය රු.	සංග්‍රහ රු.	ගමන් ගාස්තු රු.	විවිධ රු.

ගුණාත්මක යෙදවුම් :

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- සුළු මුදල් පොතක අවශ්‍යතාව දැක්වීම
- පහත පද පැහැදිලි කිරීම
  - සුළු මුදල් අග්‍රිමය
  - අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම
- දෙන ලද ගනුදෙනු ඇසුරින් සුළු මුදල් පොත පිළියෙල කර ලෙජරයට පිටපත් කිරීම
- කාලච්ඡේදය අවසානයේ සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.6: ණයට ගැණුම් ජර්නලය පිළියෙල කරයි.
කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ගැණුම් ජර්නලයක අවශ්‍යතා දැක්වීමට.
- ගැණුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීමට.
- ගැණුම් ජර්නලය ගනුදෙනු සටහන් කිරීමට.
- ගැණුම් ජර්නලයේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- ගැනුම් ජර්නලය
  නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ගන්නා භාණ්ඩ පිළිබඳ ව පළමුවරට සටහන් කරන පොත.
- මූලාශ්‍ර ලේඛන
  භාණ්ඩ මිලට ගැනීමේ දී විකුණුම්කරුගෙන් ලැබෙන ඉන්වොයිසිය
- ගනුදෙනු සටහන් කිරීම හා ලෙජරයට පිටපත් කිරීම
  දෛනික ගැණුම් ජර්නලයේ සටහන් කිරීමෙන් පසුව ලෙජරයේ ඇති ඒ ඒ ණයහිමි ගිණුම්වලට දෛනිකවම " බැර " කරයි. නිශ්චය කරගත් කාලච්ඡේදයක් අවසානයේ දී ගැණුම් ජර්නලයේ මුළු එකතුව ලෙජරයේ ඇති ගැණුම් ගිණුමට හර කරයි.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පහත සඳහන් සටහන අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරවන්න.

පියවර 1 ඉන්වොයිසිය | ඉන්වොයිසිය | ඉන්වොයිසිය

පියවර 2

ගැණුම් ජර්නලය		
දිනය	විස්තරය	වටිනාකම රු.
1/5	අමල්	10000
5/5	බිමල්	20000
20/5	චන්ත	5000
	ගැණුම් ගිණුමට හර කළා	35000

ලෙජරය

ගැණුම් ගිණුම

හර	රු.	බැර
මැයි මාසය සඳහා ණයට ගැණුම්	35000	

අමල් ගිණුම

හර	රු.	බැර
		10000

බිමල් ගිණුම

හර		බැර
		20000

චන්ත ගිණුම

හර		බැර
		5000

- පෙළපොත අධ්‍යයනය කර ඉහත පින්තූරයේ දැක්වෙන ක්‍රියාවලිය පෙළගැස්වීමට සිසුන් යොමු කරන්න.
- පහත සඳහන් අභ්‍යාස ගැණුම් ජර්නලයේ සටහන් කර ලෙජරයට පිටපත් කරවන්න.

(1)

ණයට ගැනුම්

දිනය	සැපයුම්කරු	වටිනාකම රු.
1/5	කපිල ව්‍යාපාරය	10000
7/5	නවෝද්‍යා රෙදිපිළි සමාගම	15000
23/5	ශාන්ත ටෙක්ස්ටයිල්	25000
27/5	ලලිත් ඩෙනිම්	50000
28/5	චතුනී රෙදිපිළියට	25000
31/5	වසන්තිකා නූල් සප්ලයර්	5000

(2)

ණයට ගැනුම්

දිනය	විස්තරය	වටිනාකම රු.
5/2	නිමාෂා ෆයින් ෆුඩ්	4000
5/7	සමන්තා සුපර් තේ	5000
10/7	අනිල් ස්වීට්ස් හවුස්	10000
11/7	කමල් බේකරි	5000
20/7	නිමල් හෝටලය	15000
30/7	නිමාෂා ෆයින් ෆුඩ්	5000

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- ගැණුම් ජර්නලයක් පිළියෙල කිරීමේ පදනම දක්වන්න.
- ගැණුම් ජර්නලයේ තොරතුරු සටහන් කිරීමට පදනම් මූලාශ්‍රය දැක්වීම.
- ගැණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීම.
- ගැණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කර ලෙජරය පිටපත් කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 5.7 : විකුණුම් ජර්නලය පිළියෙල කරයි.

කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- විකුණුම් ජර්නලයේ අවශ්‍යතාව දැක්වීමට.
- විකුණුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය දැක්වීමට.
- විකුණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට.
- විකුණුම් ජර්නලයේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- විකුණුම් ජර්නලය
  ව්‍යාපාරයේ භාණ්ඩ ණයට විකිණීමේ දී ඒ පිළිබඳ ව ප්‍රථම වතාවට සටහන් කරන පොත විකුණුම් ජර්නලය වේ.
- මූලාශ්‍ර ලේඛනය
  භාණ්ඩ ගැණුම්කරුට නිකුත් කරන ඉන්වොයිසිය මූලාශ්‍රය වේ.
- ගනුදෙනු සටහන් කිරීම හා ලෙජරයට **පිටපත් කිරීම**
  දෛනිකව විකුණුම්, විකුණුම් ජර්නලයේ සටහන් කිරීමෙන් පසුව ඒ ඒ වටිනාකම් එදිනට ලෙජරයේ ඇති ණයගැති ගිණුම්වලට ද පිටපත් කෙරේ. නිශ්චිත කාලච්ඡේදයක් අවසානයේ දී විකුණුම් ජර්නලයේ මුළු එකතුව ලෙජරයේ ඇති විකුණුම් ගිණුමට බැර කෙරේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :

- පහත සඳහන් සටහන අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරවන්න.

පියවර 1

ඉන්වොයිසිය → ඉන්වොයිසිය → ඉන්වොයිසිය

පියවර 2

විකුණුම් ජර්නලය		
දිනය	විස්තරය	වටිනාකම රු.
1/6	අමල් සහ සමාගම	5000
5/6	නිමල් සහෝදරයෝ	10000
26/6	කමනි සිල්ලර වෙළෙන්දෝ	30000
	විකුණුම් ගිණුමට බැර කළා	45000

ලෙජරය

විකුණුම් ගිණුම

හර			බැර	රු.
			මැයි මාසය සඳහා ණයට විකුණුම්	45000

අමල් ගිණුම

හර	රු.		බැර
විකුණුම්	5000		

නිමල් ගිණුම

හර			බැර
විකුණුම්	10000		

කමනි ගිණුම

හර			බැර
විකුණුම්	30000		

- පෙළපොත අධ්‍යයනය කර ඉහත සටහනේ දැක්වෙන ක්‍රියාවලිය පෙළගැස්වීමට සිසුන් යොමු කරන්න.
- පහත සඳහන් අභ්‍යාස විකුණුම් ජර්නලයට සටහන් කර ලෙජරයට පිටපත් කරවන්න.

(1)

ණයට විකුණුම්

දිනය	සැපයුම්කරු	වටිනාකම රු.
2/11	චතුතී ඇන්තුරියම් නිෂ්පාදකයෝ	15000
3/11	නවෝද්‍යා මල් නිපදවන්නන්	5000
11/11	සරණි මල්පැල සපයන්නන්	12000
23/11	සාරාංග ඇන්තුරියම්	6000
30/11	වාසනා මල් නිපදවන්නන්	4000

(2)

ණයට විකුණුම්

දිනය	විස්තරය	වටිනාකම රු.
1/7	මොබයිල් ෆෝන් ෂොප්	15000
5/7	මොබයිල් ෆෝන් අළුත්වැඩියා කරන්නන්	5000
14/7	ලෙදර් ප්‍රොඩක්ට්	15000
28/7	වාසනා කොමියුනිකේෂන්	2000
31/7	මොබයිල් ෆෝන් ෂොප්	5000

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය, 5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- විකුණුම් ජර්නලයක අවශ්‍යතාව දැක්වීම.
- විකුණුම් ජර්නලයක තොරතුරු සටහන් කිරීමට පදනම් කර ගන්නා මූලාශ්‍රය දැක්වීම.
- විකුණුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීම
- විකුණුම් ජර්නලය ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කිරීම.

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.8 : පොදු ජර්නලයක් පවත්වා ගනියි.
කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- පොදු ජර්නලයක අවශ්‍යතාව දැක්වීමට.
- පොදු ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරීමට.
- පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග නම් කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- පොදු ජර්නලය
  මුදල් පොත, සුළු මුදල් පොත, ගැනුම් ජර්නලය හා විකුණුම් ජර්නලය යන මූලික පොත්වල සටහන් කරන ගනුදෙනුවලට අමතර ව ඇති විවිධ ස්වරූපවල ගනුදෙනු සටහන් කරන පොත පොදු ජර්නලයයි.

- මූලාශ්‍ර ලේඛනය
  පොදු ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කරන මූලාශ්‍ර ලේඛනය වන්නේ ජර්නල් වවුචරයයි.

පොදු ජර්නලය

දිනය	ඩ.අ.	විස්තරය	ලෙ.පි.	හර රු.	බැර රු.

පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනු

- ගැළපුම් සටහන්
  කාලච්ඡේදයට අදාළ ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් වී නොමැති විට එම ගනුදෙනු සටහන් කිරීම මෙන්ම ඇතුළත් වූ ගනුදෙනු ගිණුම් කාලච්ඡේදයට අදාළ ව ගැළපීම අදාළ සටහන් ගැළපුම් සටහන් වේ.
- වැරදි නිවැරදි කිරීමේ සටහන්
  මූලික පොත්වලත්, ලෙජර් ගිණුම්වලත් ගනුදෙනු දැක්වීමේ දී වැරදි සිදුවිය හැකි ය. ඊට අදාළ නිවැරිදි කිරීමේ සටහන් තබන්නේ පොදු ජර්නලයේ ය.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පෙළපොත ද ආශ්‍රයෙන් මූලික හැඳින්වීමක් පමණක් සෑහේ.
- ඒ ඒ ගනුදෙනුවලට අදාළ නිදසුන් කිහිපයක් සාකච්ඡා කිරීම.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  5 වන පාඩම - මූලික සටහන් පොත්

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- පොදු ජර්නලයක අවශ්‍යතාව දැක්වයි.
- පොදු ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරයි.
- පොදු ජර්නලයේ ඇතුළත් කරන ගැළපුම් සටහන් හා වැරදි නිවැරදි කිරීමේ සටහන් නිදසුන් අතුරින් ඉදිරිපත් කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.
නිපුණතා මට්ටම 5.9: ලෙජර් ගිණුම් තුලනය කර ශේෂ පිරික්සුම පිළියෙල කරයි.
කාලච්ඡේද : 03

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- මූලික පොත්වල සටහන් කරන ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට.
- ලෙජර් ගිණුම් තුලනය කිරීමට.
- ශේෂ පිරික්සුම පිළියෙල කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

- මූලික පොත්වලින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.
  ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු පළමුවතාවට ජර්නල්වල සටහන් කර, පසුව ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ලෙජර් ගිණුම්වල සටහන් කෙරේ.

- ලෙජර් ගිණුම් තුලනය
  යම් නිශ්චිත කාලසීමාවක් අවසානයේ දී එක් එක් ගිණුමේ " හර " හා "බැර" පැතිවල සටහන්ව ඇති වටිනාකම්වල ශුද්ධ ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා ගිණුම් ශේෂය ලබා ගත යුතු වේ. ඒ සඳහා ලෙජර් ගිණුම් තුලනය කෙරේ.

- ශේෂ පිරික්සුම
  මූලික පොත්වල සටහන් කරන ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීමේ දී එක හා සමාන හර හා බැර වටිනාකම්වලින් යුක්ත වේ. මේ නිසා සියලුම " හර " සටහන්වල එකතුව සියලුම "බැර"සටහන්වල එකතුවට සමාන වේ. ලෙජරයේ ඇති ගිණුම්වල " හර" ශේෂ හා "බැර " ශේෂ දක්වමින් පිළියෙල කරන ලේඛනය ශේෂ පිරික්සුම වේ. ශේෂ පිරික්සුමක් පහත පරිදි වේ.

.. ව්‍යාපාරයේ
200....................... දිනට ශේෂ පිරික්සුම

විස්තරය	ස.පිටු	හර රු.	බැර රු.
		XXX	XXX

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- පහත සඳහන් මූලික පොත් හා ලෙජර් ගිණුම් අධ්‍යයනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

ගැණුම් ජර්නලය

දිනය	විස්තරය	වටිනාකම රු.
1/6	ආශා	5000
30/6	නිෂා	2000
	ගැණුම් ගිණුමට හර කළා	7000

විකුණුම් ජර්නලය

දිනය	විස්තරය	වටිනාකම රු.
2/6	නිමාලි	17000
25/6	අමාල්	5000
	විකුණුම් ගිණුමට බැර කළා	22000

ගැණුම් ගිණුම

මුදල්	3000		
30/6 මැයි මාසය සඳහා ගැණුම්	7000		

විකුණුම් ගිණුම

		මුදල්	12000
		මැයි මාසය සඳහා ණයට විකුණුම්	22000

නිෂා ගිණුම

		ගැණුම්	5000

නිමාලි ගිණුම

විකුණුම්	17000		

ආශා ගිණුම

		ගැණුම්	2000

අමාල් ගිණුම

විකුණුම්	5000		

මුදල් ගිණුම

1/6 ප්‍රාග්ධන	100000	2/6 ගැණුම්	3000
2/6 විකුණුම්	12000	5/6 උපකරණ	10000
		10/6 වැටුප්	5000
		30/6 විදුලිය	2000
		ප/ගෙ /ශේ	92000
	112000		112000

- ඉහත සඳහන් ගනුදෙනුවලින් මුදල් පොතේ සටහන් කර ඇති ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට උපදෙස් දෙන්න.
- සියලු ලෙජර් ගිණුම් තුලනය කිරීමට මග පෙන්වන්න.
- ලෙජර් ගිණුම්වල " හර " ශේෂවල එකතුව හා " බැර" ශේෂවල එකතුව ඇසුරින් පෙළ පොත අධ්‍යයනය කර ශේෂ පිරික්සුම පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.
- මෙවැනි අභ්‍යාස කීපයක් විසඳීමට සිසුන්ට ඉඩකඩ ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  7 වන පාඩම - ශේෂ පරික්සුම

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

- මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කිරීම
- ලෙජර් ගිණුම් තුලනය කිරීම
- ලෙජර් ගිණුම්වලට ශේෂය ඉදිරියට ගෙනඒම
- ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 5.10 : ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේ දී හා ලෙජරයට පිටපත් කිරීමේ දී සිදුවූ වැරදි නිවැරදි කරයි.

කාලච්ඡේද : 06

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේ දී සිදුවිය හැකි වැරදි පෙළගැස්වීමට.
- ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ දී සිදුවිය හැකි වැරදි පෙළගැස්වීමට.
- ශේෂ පිරික්සුමේ සමානත්වයට බලනොපාන වැරදි හඳුනාගෙන නිවැරදි කිරීමට.
- අවිනිශ්චිත ගිණුමේ අවශ්‍යතාව දැක්වීමට.
- අවිනිශ්චිත ගිණුම ඇසුරින් වැරදි නිවැරදි කිරීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ගනුදෙනු මූලික පොත්වලට සටහන් කිරීමේ දී පහත සඳහන් ආකාරයට දෝෂ ඇතිවිය හැකි ය.

- ඉන්වොයිසිය මුළුමණින්ම මගහැරීම
- ගැණුම් ජර්නලයේ/ විකුණුම් ජර්නලයේ මුළු එකතුවට අඩු වැඩි ලෙස ශේෂ කිරීම
- ගැණුම් ජර්නලයේ/ විකුණුම් ජර්නලයේ මුළු එකතුව ලෙජරයේ ගිණුම්වලට අඩු වැඩි ලෙස පිටපත් කිරීම.
- ලෙජර් ගිණුම්වලට අඩු වැඩි ලෙස පිටපත් කිරීම
- ගනුදෙනුවක එක් සටහනක් නිවැරදිවත්, අනෙක් සටහන වැරදියට පිටපත් කිරීම
- ගණුදෙනු ලෙජර් ගිණුම්වල වැරදි පැත්තේ පිටපත් කිරීම
- ලෙජර් ගිණුම්වල පිටපත් කළ යුතු ගනුදෙනුවක් මුළුමණින්ම මගහැරීම
- ගනුදෙනුවක් ලෙජරයට පිටපත් කිරීමේ දී සිදුවන වැරද්ද හිලව් වීම.
- ගනුදෙනුව වැරදි ගිණුමකට පිටපත් කිරීම.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :(1)

- පහත සඳහන් ව්‍යාපාරික ගනුදෙනු හා ඒවා ලෙජරයේ පිටපත් කර ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

ගනුදෙනු

(1) ණයට විකුණුම් රු. 15000කි.
(2) භාණ්ඩ ණයට ගැණුම් රු. 5000 කි.
(3) වැටුප් ගෙව්වා රු. 8000 කි.
(4) ප්‍රචාරණ වියදම් රු. 2500 කි.
(5) ණයගැතියකු වූ කමල්ගෙන් රු. 12000 ක් ලැබුණා.
(6) වරිපනම් ගෙව්වා රු. 1000 කි.
(7) බැංකු ණයක් ගත්තා රු. 50000 කි.
(8) අත්පිට විකුණුම් රු. 10000 කි.

විකුණුම් ගිණුම

	8 මුදල් 11000

ගෘහ භාණ්ඩ ගැණුම් ගිණුම

2 මුදල් 5000	

වැටුප් ගිණුම

	3 මුදල් 8000

ප්‍රචාරණ වියදම් ගිණුම

4 මුදල් 2000	

වරිපනම් ගිණුම

6 මුදල් 2500	

කමණි ගිණුම

	5 මුදල් 12000

මුදල් ගිණුම

3 වැටුප් 8000	ගෘහ භා. 5000
5 කමල් 12000	ප්‍රචාරණ 2000
7 බැංකු ණය50000	වරිපනම් 1000
8 විකුණුම් 11000	

බැංකු ණය ගිණුම

	7 මුදල් 50000

- එම ගනුදෙනුවල ද්විත්ව සටහන ලිවීමට සිසුන් යොමු කරන්න.
- මෙම ක්‍රියාවලිය අතරතුර ගනුදෙනු ලෙජර් ගිණුම්වල පිටපත් කර ඇති ආකාරය විමසන්න.
- මෙම ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කර ඇති ආකාරය හා ශේෂ පිරික්සුම අතර සම්බන්ධය විමසන්න.
- ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී එයට බලපෑමක් නොකරන ගනුදෙනු හේතුවෙන් ව්‍යාපාරයේ තොරතුරු සැපයීමේ දී නිවැරදි තොරතුරු සැපයීමට අපහසු වන ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :02

- පහත සඳහන් ව්‍යාපාරික ගනුදෙනු හා ඒවා ලෙජරයේ පිටපත් කර ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.

ගනුදෙනු

1 වැටුප් ගෙවීම රු 1500

2 අත්පිට විකුණුම් රු 52000

3 ණය ගැතියෙකුගෙන් මුදල් ලැබුණා රු 4000

4 විකුණුම් ජර්නලය එකතු කිරීමේදී රු 4500 ක් අඩුවීම

මුදල් ගිණුම

2 විකුණුම්	52000	1 වැටුප්	1500
3 ණයගැති	4000		

වැටුප් ගිණුම

1 මුදල්	1000		

විකුණුම් ගිණුම

		2 මුදල්	57000

ණයගැති ගිණුම

3 මුදල්	4000		

1 ඉහත ගනුදෙනුවල ද්විත්ව සටහන් ලිවීමට සිසුන් යොමු කරන්න

2 ඒ අනුව ඉහත ලෙජර් ගිණුම්වල තබා ඇති ද්විත්ව සටහන පරීක්ෂා කිරීමට යොමු කරන්න

3 ඉහත ගනුදෙනු සටහන් කිරීමේදී සිදුවී ඇති වැරදි සටහන් හඳුනා ගෙන ඉන් ශේෂ පිරික්සුමට වන බලපෑම දක්වන්න

4 ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී එයට බලපෑමක් ඇති වන ගනුදෙනු හේතුවෙන් ව්‍යාපාරයේ තොරතුරු සැපයීමේ දී නිවැරදි තොරතුරු සැපයීමට අපහසු වන ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

5 පොදු ජර්නලය භාවිත කරගෙන එම ගිණුම්කරණ දෝෂ නිවැරදි කළ යුතු ආකාරය සාකච්ඡා කරන්න.

6 පෙළපොත අධ්‍යයනයෙන් අවිනිශ්චිත ගිණුමක අවශ්‍යතාව සාකච්ඡා කරන්න.

7 පහත සඳහන් ආකාරයේ අභ්‍යාස කිහිපයක් සිසුන්ට විසඳීමට අවශ්‍ය මගපෙන්වීමක් කරන්න.

අභ්‍යාස (1)

(1) රු. 8000ක් වටිනා ණයට විකුණුම් ඉන්වොයිසිය අස්ථානගත වීම.
(2) වැටුප රු. 5000 ක් ගෙවීම. මුදල් පොතේ නිවැරදිව බැර කර ඇතත්, වැටුප් ගිණුමට රු. 500 ක් ලෙස හර කිරීම.
(3) ප්‍රචාරණ වියදම් රු. 2500 ක් ගෙවීම. මුදල් පොතට හා ප්‍රචාරණ වියදම් ගිණුමට පිටපත් කිරීම මඟහැරීම.
(4) රක්ෂණ ගාස්තුව රු. 5000 ක් ගෙවීම. මුදල් පොතට රු. 5000 ක් බැර කර වරිපනම් ගිණුම රු.5000 ක් හර කර තිබීම.
(5) යන්ත්‍ර අළුත්වැඩියාව සඳහා දරන ලද රු. 2500 ක් යන්ත්‍ර ගිණුමට හර කර තිබීම.
(6) ණයගැතියකු වූ කමල්ගෙන් ලද රු. 5000 ක් කමනිගේ ගිණුමට බැර කර තිබීම.
(7) ණයහිමියෙකු වූ කපිලට ගෙවූ රු. 8000 ක් දෙවරක් මුදල් පොතේ හා කපිලගේ ගිණුමට පිටපත් කිරීම.

අභ්‍යාස (2)

(1) රු. 12000 ක් වටිනා භාණ්ඩ ගැණුම් ගිණුම්වලට ඇතුළත් කර නොමැත.
(2) රු. 1000 ක් පෞද්ගලික පරිහරණයට ගෙන ඇත. මෙම ගනුදෙනුවට අදාළ ව මුදල් පොතේ පමණක් පිටපත් කර ඇත.
(3) රු. 5000 ක් වැටුප් ගෙවීමට වරිපනම් ලෙස සළකා ගිණුම්වලට පිටපත් කර ඇත.
(4) රක්ෂණ ගාස්තු රු. 2500 ක් ගෙවීම පොත්වලට ඇතුළත් කිරීම මගහැරී ඇත.
(4) රු. 15000 ක් වටිනා ණයට ගැණුම් පිළිබඳ ව කිසිදු සටහනක් තබා නැත.

අවශ්‍ය වන්නේ

1. ජර්නල් සටහන්
2. අවිනිශ්චිත ගිණුම

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය ,
  8 වන පාඩම - ගිණුම්කරණ වැරදි නිවැරදි කිරිම

තක්සේරුව හා ඇගයීම සඳහා උපදෙස් :

- ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේ දී සිදුවිය හැකි වැරදි සඳහා නිදසුන් දැක්වීම.
- ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීමේ දී සිදුවිය හැකි වැරදි සඳහා නිදසුන් දැක්වීම.
- වැරදි නිවැරදි කිරීමට අදාළ ජර්නල් සටහන් නිදසුන් ඇසුරින් දැක්වීම.
- අවිනිශ්චිත ගිණුමක් ඇසුරින් ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම

නිපුණතාව 5 : මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 5.11 : ක්ෂණික මුදල් ගනුදෙනු සිදු කිරීම හා ප්‍රතිඵල අනාවරණය කර ගැනීම සඳහා තාක්ෂණික ක්‍රමවේද භාවිත කරයි.

කාලච්ඡේද : 02

සුවිශේෂ ඉගෙනුම් ඵල

මෙම ක්‍රියාකාරකම අවසානයේ දී ශිෂ්‍යයාට පහත සඳහන් ඉගෙනුම් ඵල ලඟාකර ගත හැකි වේ.

- ජංගම දුරකථන සේවාව ආශ්‍රිත මුදල් ගනුදෙනු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දැක්වීමට.
- ජංගම දුරකථන සේවාව ආශ්‍රිත මුදල් ගනුදෙනු සඳහා නිදසුන් සැපයිමට.
- ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිතයෙන් ගනුදෙනු කිරීමෙන් ලබාගත හැකි වාසි දැක්වීමට.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

මූලික පද හා සංකල්ප

ගනුදෙනු සඳහා ක්ෂණික ගෙවීම්

සන්නිවේදන හා තොරතුරු තාක්ෂණයේ ප්‍රවණතාවක් ලෙස ජංගම දුරකථන හා පරිගණකය යන උපකරණ භාවිත කරමින් අන්තර්ජාල පහසුකම් යටතේ ව්‍යාපාරවල ගනුදෙනු සිදුවීම බහුලව සිදුවේ. *නිදසුන් :*
- ගෙවීම්
- මිල විමසීම්
- වෙනත් මුදල් ගෙවීම්, බිල් ආදිය

ඉලෙක්ට්‍රානික ගත ගනුදෙනු සිදුවීම්

ජංගම දුරකථන භාවිතයෙන්, කෙටි පණිවුඩ සේවා මගින් හා කථනය මගින් ගනුදෙනුවක් ආරම්භයේ සිට අවසානය දක්වා සිදු කළ හැකි ය. එමෙන් ම පරිගණක භාවිතයෙන් ද ව්‍යාපාර අතර ගනුදෙනු සිදු කෙරේ. එනම් වෙළෙඳ පොළ සොයායාමේ සිට භාණ්ඩ හෝ සේවාව විකිණීම තෙක් සියලු කටයුතු පරිගණකය භාවිත කර අන්තර්ජාල පහසුකම් ඔස්සේ සිදු කරයි.

ඉලෙක්ට්‍රෝනික ගත ගනුදෙනු කිරීමේ වාසි

- අවශ්‍ය උපකරණ (ජංගම දුරකථනය, පරිගණකය) ගනුදෙනුකරු අසලම තිබීම නිසා ගනුදෙනුව ක්ෂණිකව සිදුවේ.
- ගනුදෙනුව සිදුවීමත් සමඟම සියලු පාර්ශ්වයන් එක්ව දැනුවත්වීමක් හා ප්‍රතිචාර දැක්වීමත් ක්ෂණිකව සිදුවේ.
- කාලය ඉතිරිවීම නිසා ගනදෙනු කිරීම පහසුවීම.
- ගනුදෙනු රාශියක් එකවිට සිදු කිරීමට හැකිවේ.

ක්‍රියාකාරකම් සැලසුම සඳහා උපදෙස් :

- මෙම ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව නියුතු ව්‍යාපාරිකයකු/ බැංකු නියෝජිතයකු පන්ති කාමරයට ගෙන්වා, මෙවැනි ගනුදෙනු සිදුවන ආකාරය හා ඉන් ඇති ප්‍රයෝජන පිළිබඳ සිසුන් දැනුවත් කිරීමකට යොමු කරන්න. (විනාඩි 40)

- එම සාකච්ඡාවෙන් පසු අදාළ විෂය කරුණු හා ඉගෙනුම් ඵල සංවර්ධනය කෙරෙන ආකාරයට සිසුන් සමග සාකච්ඡාවක් කර, සටහනක් ගොඩනගා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන පෙළපොත - 10 ශ්‍රේණිය
  8 වන පාඩම -

තක්සේරුව හා ඇගයීම් නිර්ණායක :

1. ජංගම දුරකථන සේවාව ආශ්‍රිතව කළ හැකි ගනුදෙනු 2ක් සඳහා නිදසුන් දෙකක් සැපයීම.
2. පරිගණකය භාවිත කර කළ හැකි ගනුදෙනු දෙකක් සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම.
3. ජංගම දුරකථනය/ පරිගණකය භාවිතයෙන් ගනුදෙනු කිරීමේ ප්‍රයෝජන තුනක් දැක්වීම.